69034

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව I<br>பொருளியல் I<br>Economics I | 21 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (×) **යොදා දක්වන්න**.

**1.** ආර්ථික විද්‍යාව පිළිබඳ වඩාත් සම්පූර්ණ කෙටි නිර්වචනයක් වනුයේ ආර්ථික විද්‍යාව යනු,
(1) තම පුරවැසියන්ට වඩාත් යහපත් තත්ත්වයක් ඇති කිරීම සඳහා සමාජයේ ක්‍රියා අවස්ථා නිර්මාණය කළ හැක්කේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම ය.
(2) රටවල් ගෝලීය වෙළෙඳපොළක භාණ්ඩ හා සේවා වෙළෙඳාම් කරනුයේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම ය.
(3) පරිසරයට හානියක් නොවන පරිදි භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරනු ලබන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම ය.
(4) සීමිත වුවමනා අතර අසීමිත සම්පත් බෙදා වෙන්කරනු ලබන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම ය.
(5) අසීමිත වුවමනා සපුරාලීම සඳහා හිඟ සම්පත් බෙදා වෙන්කරනු ලබන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම ය.

**2.** නිෂ්පාදන හැකියා පර්යන්තයන් සරල රේඛීය වනුයේ,
(1) සම්පත් පූර්ණ වශයෙන් සහ කාර්යක්ෂමව උපයෝජනය කරමින් පවත්නා නිසා ය.
(2) වැඩෙන ආවස්ථික පිරිවැය නීතිය නිසා ය.
(3) ආර්ථිකයේ පවත්නා අකාර්යක්ෂමතා නිසා ය.
(4) ආවස්ථික පිරිවැය ස්ථාවර වීම නිසා ය.
(5) සම්පත් සමජාතීය නොවීම නිසා ය.

**3.** පහත සඳහන් කවරක් නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයෙහි මූලික ලක්ෂණයක් වේ ද?
(1) නිෂ්පාදනය පිළිබඳ රජයේ දැඩි පාලනය
(2) අපනයනවලට වඩා වැඩි ආනයන
(3) සම්පත් පිළිබඳ පොදු අයිතිය
(4) පෞද්ගලික දේපළ
(5) රජය විසින් නියමකළ මිල සහ වැටුප්

**4.** ශ්‍රමික විභාජනයෙන් අත්වන ප්‍රතිලාභයක් **නොවන්නේ** කුමක් ද?
(1) ශ්‍රම බලකායේ නම්‍යශීලීත්වය ඉහළ යාම
(2) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ මුළු පිරිවැය පහළ යාම
(3) ඵලදායීතාව ඉහළ යාම
(4) නවෝත්පාදන හඳුන්වාදීමේ හැකියාව ඉහළ යාම
(5) ආදායම් සමතාව ඉහළ යාම

**5.** සහල් මිල වැඩිවන විට අපේක්ෂා කරනුයේ
(1) සහල් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ වැඩි වීමකි.
(2) සහල් සැපයුම් කරනු ලබන ප්‍රමාණයේ අඩු වීමකි.
(3) සහල් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ අඩු වීමකි.
(4) සහල් ඉල්ලුම අඩු වීමකි.
(5) සහල් සැපයුම වැඩි වීමකි.

[දෙවැනි පිටුව බලන්න

**6.** ඇඟලුම් නිෂ්පාදනයේ ප්‍රධාන යෙදවුමක් වන්නේ රෙදිපිළි බව සලකන්න. අනෙකුත් කරුණු නො වෙනස් ව තිබියදී, රෙදිපිළි මිල පහළ බසී නම්, එහිදී අපේක්ෂා කරනුයේ

(1) රෙදිපිළි ඉල්ලුම ඉහළ යාමකි. (2) ඇඟලුම් සැපයුම ඉහළ යාමකි.
(3) ඇඟලුම් සැපයුම පහළ යාමකි. (4) ඇඟලුම් ඉල්ලුම ඉහළ යාමකි.
(5) ඇඟලුම් ඉල්ලුම පහළ යාමකි.

**7.** X භාණ්ඩයේ සැපයුම් ශ්‍රිතය, $Q_S = 8P$ සමීකරණයෙන් දැක්වෙන අතර, එහි P භාණ්ඩයේ මිලත් $Q_S$ සැපයුම් කරනු ලබන ප්‍රමාණයත් පෙන්නුම් කරයි. මෙම සමීකරණයට අනුව X භාණ්ඩයේ සැපයුමෙහි මිල නම්‍යතාව

(1) 1.0 කි. (2) –1.0 කි. (3) 8.0 කි. (4) –8.0 කි. (5) 0.1 කි.

**8.** අලිගැටපේර සඳහා ඇති වෙළෙඳපොළ එකවර සිදුවීම් දෙකකට මුහුණ පා ඇතැයි සලකමු. අලිගැටපේර සැපයුමට බලපාන දැඩි නියඟයක් පැවැතිය දී පිළිකා රෝග වළක්වා ගැනීමට උපකාරී විය හැකි ඖෂධීය ගුණ අලිගැටපේරවල අඩංගු බව පර්යේෂණයක් මගින් පෙන්වා දී තිබේ. මෙම සිදුවීම් දෙක අලිගැටපේර වෙළෙඳපොළෙහි සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය කෙරෙහි කෙසේ බලපානු ලබන්නේ ද?

| | සමතුලිත මිල | සමතුලිත ප්‍රමාණය |
|---|---|---|
| (1) | වැඩි වේ | අඩු වේ |
| (2) | වැඩි වේ | වැඩි වේ |
| (3) | අඩු වේ | අඩු වේ |
| (4) | වැඩි වේ | අවිනිශ්චිත වේ |
| (5) | අඩු වේ | අවිනිශ්චිත වේ |

**9.** X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළ දැනට සමතුලිතයෙහි පවතී යැයි සලකන්න. X භාණ්ඩයේ සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය යන දෙකම අඩු කිරීමට හේතු **නොවන්නේ** පහත සඳහන් කවර සිදුවීමක් ද?

(1) X භාණ්ඩය සඳහා අනුපූරක භාණ්ඩයක් වන Y භාණ්ඩයේ මිල ඉහළ යාම
(2) X භාණ්ඩය සඳහා ආදේශක භාණ්ඩයක් වන Y භාණ්ඩයේ මිල පහළ යාම
(3) X භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් වීම සහ පාරිභෝගික ආදායම් පහළ යාම
(4) X භාණ්ඩය බාල භාණ්ඩයක් වීම සහ පාරිභෝගික ආදායම ඉහළ යාම
(5) X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළෙහි ගැනුම්කරුවන් සංඛ්‍යාව ඉහළ යාම

**10.** එක්තරා කුඩා නගරයක පලාකොළ සඳහා ඇති දෛනික වෙළෙඳපොළ ඉල්ලුම හා සැපයුම පහත සඳහන් වගුවේ පෙන්නුම් කරයි.

| කිලෝ ග්‍රෑමයක මිල (රු.) | දෛනික ඉල්ලුම් ප්‍රමාණය (කි.ග්‍රෑ.) | දෛනික සැපයුම් ප්‍රමාණය (කි.ග්‍රෑ.) |
|---|---|---|
| 60 | 220 | 310 |
| 55 | 240 | 300 |
| 50 | 260 | 290 |
| 45 | 280 | 280 |
| 40 | 300 | 270 |

ප්‍රවාහන වියදම් ඉහළ යාම නිසා පලාකොළ සැපයුම සෑම මිලකදී ම කිලෝ ග්‍රෑම් 60කින් අඩු වේ යැයි සලකන්න. පලාකොළ සඳහා අලුත් සමතුලිත මිල කොපමණ ද?

(1) රු. 60 (2) රු. 55 (3) රු. 50 (4) රු. 45 (5) රු. 40


**11.** භාණ්ඩයක මිල රු. 40 සිට රු. 50 දක්වා ඉහළයාම, එම භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ඒකක 1 600 සිට ඒකක 1 400 දක්වා අඩු කිරීමට හේතු වේ යැයි සලකන්න. ඉල්ලුම් වක්‍රයේ මෙම පරාසය තුළ, ඉල්ලුමේ මිල නම්‍යතාව

(1) – 6.0 කි. (2) – 3.0 කි. (3) – 0.7 කි. (4) – 0.6 කි. (5) – 0.3 කි.

**12.** කිසියම් භාණ්ඩයක් සඳහා නිදහස් වෙළෙඳපොළ සමතුලිත මිලට වඩා ඉහළ, සහතික කළ අවම මිලක් හඳුන්වාදීමේ දී රජයට දැරීමට සිදුවන පිරිවැය වඩාත් අධික වනුයේ,

(1) ඉල්ලුමත් සැපයුමත් යන දෙකම මිල නම්‍ය වේ නම් ය.
(2) ඉල්ලුමත් සැපයුමත් යන දෙකම මිල අනම්‍ය වේ නම් ය.
(3) ඉල්ලුම මිල නම්‍ය වී සැපයුම මිල අනම්‍ය වේ නම් ය.
(4) ඉල්ලුම මිල අනම්‍ය වී සැපයුම මිල නම්‍ය වේ නම් ය.
(5) ඉල්ලුමත් සැපයුමත් යන දෙකම ඒකීය මිල නම්‍යතාවකින් යුක්ත වේ නම් ය.

**13.** පහත දැක්වෙන රූපසටහන X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළ නිරූපණය කරයි. තරගකාරී වෙළෙඳපොළ සමතුලිතය E ලක්ෂ්‍යය වේ. රජය විසින් X භාණ්ඩයේ නිෂ්පාදනය මත ඒකක බද්දක් පනවනු ලැබේ යැයි සලකන්න.




බද්ද නිසා රජය උපයාගත් අයභාරය සහ අහිමි වූ සුබසාධනය ප්‍රස්තාරයේ කවර ප්‍රදේශයකින් පෙන්නුම් කෙරේ ද?

| | බදු අයභාරය | අහිමි වූ සුබසාධනය |
|---|---|---|
| (1) | P N F T | F T E |
| (2) | 0 N F $Q_3$ | K T E |
| (3) | J P T K | K F E |
| (4) | J N F K | K F E |
| (5) | J N F K | K T E |

**14.** තරගකාරී වෙළෙඳපොළක එක්තරා භාණ්ඩයක සමතුලිත මිල ඒකකයක් රු. 50ක් බව සලකන්න. දැන් මෙම වෙළෙඳපොළට රජය මැදිහත්ව ඒකකයක් රු. 60ක් ලෙස අවම මිලක් පනවනු ලබයි. වෙළෙඳපොළෙහි එක ගැනුම්කරුවකුගේ ඉල්ලුම් ශ්‍රිතය $Q_d = 240 - 3P$ නම් අවම මිල, එම ගැනුම්කරුවාගේ පාරිභෝගික අතිරික්තයට කරනු ලබන බලපෑම කුමක් ද?

(1) රු. 600කින් වැඩි වේ.
(2) රු. 600කින් අඩු වේ.
(3) රු. 750කින් වැඩි වේ.
(4) රු. 750කින් අඩු වේ.
(5) රු. 1 350කින් අඩු වේ.

**15.** කෙටි කාලයේ දී නිෂ්පාදන ආයතනයක් විසින් විවිධ නිමැවුම් මට්ටම් සඳහා දරනු ලබන මුළු පිරිවැය පහත දැක්වෙන වගුව පෙන්නුම් කරයි.

| නිමැවුම් මට්ටම | මුළු පිරිවැය (රු.) | නිමැවුම් මට්ටම | මුළු පිරිවැය (රු.) |
|---|---|---|---|
| 0 | 100 | 4 | 160 |
| 1 | 120 | 5 | 190 |
| 2 | 130 | 6 | 238 |
| 3 | 138 | 7 | 296 |

මෙම තොරතුරුවලට අනුව නිමැවුම් ඒකක 6ක් නිෂ්පාදනය කිරීමේ දී සාමාන්‍ය විචල්‍ය පිරිවැය කොපමණ වේ ද?

(1) රු. 23 (2) රු. 28 (3) රු. 35 (4) රු. 36 (5) රු. 48

**16.** කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී ආයතනයක්, එම ආයතනයේ ලාභ උපරිම කෙරෙන නිමැවුම් ප්‍රමාණය ලෙස ඒකක 1 000ක් නිපදවන විට වෙළෙඳපොළ මිල ඒකකයක් රු. 120ක් ද, ඒකකයක විචල්‍ය පිරිවැය රු. 100ක් ද, ඒකකයක ස්ථාවර පිරිවැය රු. 40ක් ද වේ. අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී නම්, මෙම ආයතනයේ කෙටිකාලීන හැසිරීම විය යුත්තේ

(1) පිරිවැය අඩුකර ගැනීම සඳහා නිමැවුම අඩු කිරීම ය.
(2) රු. 140කට වඩා වැඩි ප්‍රමාණයකින් ඒකකයක මිල වැඩි කිරීම ය.
(3) ආයතනය කෙටි කාලයෙහි කටයුතු කරන බැවින් නිෂ්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යාම ය.
(4) සාමාන්‍ය ස්ථාවර පිරිවැය අඩු කර ගැනීම සඳහා නිමැවුම වැඩි කිරීම ය.
(5) සාමාන්‍ය මුළු පිරිවැය වෙළෙඳපොළ මිලට වඩා ඉහළින් පවත්නා බැවින් වහාම වසා දැමීම ය.

**17.** කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී ආයතනයක් සඳහා පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?

(1) ආයතනය සැමවිට ම ධනාත්මක ආර්ථික ලාභ උපයයි.
(2) ආයතනය සැමවිට ම ප්‍රාමාණික ලාභ උපයයි.
(3) සාමාන්‍ය මුළු පිරිවැයට වඩා මිල පහළ වැටෙන විට ආයතනය වසා දමයි.
(4) මිල ආන්තික අයභාරයට සමාන වන ලක්ෂ්‍යයෙහි නිෂ්පාදනය කරමින් ආයතනය ලාභ උපරිම කරයි.
(5) ආයතනය ඍණාත්මක හෝ ධනාත්මක හෝ ප්‍රාමාණික හෝ ලාභ ඉපැයීමට පුළුවන.

**18.** පහත දැක්වෙන ශ්‍රී ලංකාවේ කර්මාන්ත අතුරින් වඩාත් ඒකාධිකාරීතරග කර්මාන්තයක් විය හැක්කේ කවරක් ද?

(1) ටයර් නිෂ්පාදනය (2) රූපවාහිනී විකාශනය (3) සිසිල් බීම
(4) ප්‍රවෘත්ති පත්‍ර (5) රූපලාවන්‍යාගාර

**19.** පහත සඳහන් දෑ අතුරින් ආර්ථික පසුබෑසීමක (ප්‍රතිගමනයක) ලක්ෂණයක් **නොවනුයේ** කුමක් ද?

(1) ආයෝජනය සහ සේවා නියුක්තිය පහළ බැසීම ය.
(2) යෙදවුම් සඳහා ඉල්ලුම වැඩි වීම නිසා යෙදවුම් මිල ඉහළ යාම ය.
(3) ආයෝජකයන්ගේ විශ්වාසනීයත්වය බිඳ වැටීම ය.
(4) භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම පහත වැටීම ය.
(5) කර්මාන්තවල අතිරික්ත නිෂ්පාදන ධාරිතාවක් පැවතීම ය.

**20.** වී ගොවියෙක් තම වී තොගය රු. 10 000කට සහල් මෝල්කරුවකුට අලෙවි කරන අතර, සහල් මෝල්කරුවා ඒවා සහල් පිටි මෝල්කරුවකුට රු. 12 000කට අලෙවි කරයි. පිටි මෝල්කරුවා එම පිටි නූඩ්ල්ස් නිෂ්පාදකයෙකුට රු. 15 000කට අලෙවි කරන අතර, නූඩ්ල්ස් නිෂ්පාදකයා එම නූඩ්ල්ස් රු. 20 000කට පරිභෝගිකයන්ට අලෙවි කරයි. මෙම නිෂ්පාදන ක්‍රියාවලියේ දී සහල් මෝල්කරු හා නූඩ්ල්ස් නිෂ්පාදකයා යන දෙදෙනා විසින් බිහිකරනු ලබන මුළු එකතු කළ අගය කොපමණ ද?

(1) රු. 10 000 (2) රු. 7 000 (3) රු. 5 000 (4) රු. 3 000 (5) රු. 2 000

**21.** ආදායම් ප්‍රවේශය ඔස්සේ දළ ජාතික ආදායම ඇස්තමේන්තු කිරීමේ දී ඇතුළත් **නොකෙරෙනුයේ** පහත සඳහන් දෑ අතුරින් කවරක් ද?

(1) සේවක ආදායම්
(2) මිශ්‍ර ආදායම
(3) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය
(4) නිෂ්පාදනය මත වෙනත් බදු අඩු කළා එම සහනාධාර
(5) සේවක අර්ථසාධක අරමුදලට සේවකයන්ගේ දායකත්ව මුදල

**22.** 2019 වර්ෂයේදී, පවත්නා වෙළෙඳපොළ මිල යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර්

(1) බිලියන 79කි. (2) බිලියන 80කි. (3) බිලියන 83කි.
(4) බිලියන 84කි. (5) බිලියන 88කි.

**23.** පහත සඳහන් ගුණක අතර සම්බන්ධතා අතුරින් නිවැරදි සම්බන්ධතාව වන්නේ කවරක් ද?

(1) ආයෝජන ගුණකය > බදු ගුණකය = තුලිත අයවැය ගුණකය
(2) බදු ගුණකය = ආයෝජන ගුණකය < තුලිත අයවැය ගුණකය
(3) බදු ගුණකය > ආයෝජන ගුණකය > තුලිත අයවැය ගුණකය
(4) බදු ගුණකය > ආයෝජන ගුණකය = තුලිත අයවැය ගුණකය
(5) ආයෝජන ගුණකය > බදු ගුණකය > තුලිත අයවැය ගුණකය

**24.** රාජ්‍ය අංශයක් නොමැති සංවෘත ආර්ථිකයක සමාහාර ඉතුරුම් ශ්‍රිතය $(S) = -100 + 0.25\,Y$ සහ ආයෝජනය (I) රුපියල් මිලියන 800ක් ද වේ යැයි සලකන්න. මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම කොපමණ ද?

(1) රුපියල් මිලියන 1 200 (2) රුපියල් මිලියන 2 800
(3) රුපියල් මිලියන 3 200 (4) රුපියල් මිලියන 3 600
(5) රුපියල් මිලියන 3 900

**25.** චක්‍රීය ආදායම් ප්‍රවාහයේ කාන්දුවීමකට උදාහරණයක් වන්නේ පහත සඳහන් කවරක් ද?

(1) ආයෝජන (2) සංක්‍රාම (3) ආනයන
(4) ආණ්ඩුවේ මිල දී ගැනීම් (5) අපනයන

**26.** යම් දෙන ලද අවස්ථාවක කිසියම් රටක පොදු මිල මට්ටම තුන් ගුණයකින් වැඩි වූයේ යැයි සලකන්න. එම කාලය තුළ එක්තරා කුටුම්බයක ආදායම රු. 40 000 සිට රු. 80 000 දක්වා වැඩි විය. මෙම කුටුම්බයේ නාමික හා මූර්ත ආදායමට කුමක් වී ද?

| | නාමික ආදායම | මූර්ත ආදායම |
|---|---|---|
| (1) | වැඩි විය | අඩු විය |
| (2) | අඩු විය | අඩු විය |
| (3) | වැඩි විය | වැඩි විය |
| (4) | අඩු විය | වැඩි විය |
| (5) | වැඩි විය | වෙනස් නොවීය |

**27.** කුටුම්බ විසින් වත්කමක් වශයෙන් මුදල් ශේෂ වැඩියෙන් ඉල්ලුම් කරනුයේ,
(1) පොදු මිල මට්ටම ඉහළ නගින විට ය.
(2) නාමික ජාතික ආදායම පහළ වැටෙන විට ය.
(3) නාමික ජාතික ආදායම ඉහළ නගින විට ය.
(4) නාමික පොලී අනුපාතිකය පහළ වැටෙන විට ය.
(5) පිළිනපත් මිල පහළ වැටෙන විට ය.

**28.** පහත සඳහන් ඈ අතුරින් වඩාත් ද්‍රවශීල වනුයේ කවරක් ද?
(1) ස්ථාවර තැන්පතු
(2) ආණ්ඩුවේ සුරැකුම්පත්
(3) ඉල්ලුම් තැන්පතු
(4) මූර්ත දේපල
(5) සමාගම්වල කොටස්


**29.** ගනුදෙනුකරුවෙක් වාණිජ බැංකුවක රු. මිලියන 400ක් තැන්පත් කරන බවත් බැංකුව එම තැන්පතුව වෙනුවෙන් රු. මිලියන 80ක ව්‍යවස්ථාපිත සංචිතයක් තබාගන්නා බවත් සලකන්න. මෙහිදී අනෙකුත් කරුණු නොවෙනස් ව පවතී නම්, වාණිජ බැංකුව සතුව කොතරම් අධි සංචිත පවතී ද? තැන්පතු ගුණකයේ විශාලත්වය කොපමණ ද?

| | අධි සංචිත (රු. මිලියන) | තැන්පතු ගුණකය |
|---|---|---|
| (1) | 400 | 0.02 |
| (2) | 400 | 0.2 |
| (3) | 320 | 20.0 |
| (4) | 320 | 5.0 |
| (5) | 320 | 0.2 |

**30.** පහත සඳහන් කවරක ප්‍රතිඵලයක් වශයෙන් මුදල් සැපයුම වැඩි වන්නේ ද?
(1) නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකයේ (SDFR) ඉහළ නැඟීමක්
(2) මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට පිළිනපත් අලෙවි කිරීමක්
(3) වට්ටම් අනුපාතිකය ඉහළ නැඟීමක්
(4) මහ බැංකුවේ විදේශ වත්කම් පහළ වැටීමක්
(5) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහළ වැටීමක්

**31.** පොදු සම්පත්වල ප්‍රධාන ලක්ෂණ වනුයේ,
(1) පරිභෝජනයේ තරගකාරිත්වය හා බැහැර කළ නොහැකි වීම ය.
(2) පරිභෝජනයේ තරගකාරිත්වයක් නොමැතිකම හා බැහැර කළ හැකි වීම ය.
(3) පරිභෝජනයේ තරගකාරිත්වයක් නොමැතිකම හා බැහැර කළ නොහැකි වීම ය.
(4) නියාමනය කළ හැකි වීම හා බැහැර කළ හැකි වීම ය.
(5) පරිභෝජනයේ තරගකාරිත්වය හා බැහැර කළ හැකි වීම ය.

**32.** පෞද්ගලික සහ සමාජ ආන්තික පිරිවැය වක්‍රත්, වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රයත් පහත රූපසටහන පෙන්නුම් කරයි.




මෙම වෙළෙඳපොළ නියාමනයකින් තොර නිදහස් වෙළෙඳපොළක් වේ නම්, එහි
(1) නිමැවුම් මට්ටම සමාජයීය වශයෙන් ප්‍රශස්ත වන නමුදු මිල ඉතා අඩු අගයක් ගනියි.
(2) නිමැවුම් මට්ටම සමාජයීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා අඩු නමුදු මිල ඉතා අඩු අගයක් ගනියි.
(3) සම්පත් බෙදා වෙන් කිරීම ඉතා කාර්යක්ෂම වනු ඇත.
(4) අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ඇත.
(5) අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ඇත.

**33.** අයවැය ලේඛනයේ ප්‍රාථමික ශේෂය යනු,

(1) ආණ්ඩුවේ මුළු වියදම සහ මුළු පුනරාවර්තන වියදම අතර වෙනස ය.
(2) ආණ්ඩුවේ අයවැය හිඟය සහ ණය සේවා ගෙවීම් අතර වෙනස ය.
(3) මුළු අයභාරය සහ ණය සඳහා පොලී ගෙවීම් ඇතුළත් මුළු වියදම අතර වෙනස ය.
(4) දීමනා ඇතුළත් මුළු අයභාරය සහ ණය සඳහා පොලී ගෙවීම් ඇතුළත් මුළු ප්‍රාග්ධන වියදම අතර වෙනස ය.
(5) දීමනා අතුළත් මුළු අයභාරය සහ ණය සඳහා පොලී ගෙවීම් ඇතුළත් මුළු පුනරාවර්තන වියදම අතර වෙනස ය.


**34.** 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකා මධ්‍යම රජයේ නොපියවූ මුළු දේශීය හා විදේශීය ණය ප්‍රමාණයන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් පිළිවෙළින්

(1) 44.1% ක් සහ 42.6% ක් විය. (2) 48.2% ක් සහ 40.3% ක් විය.
(3) 35.4% ක් සහ 46.6% ක් විය. (4) 42.7% ක් සහ 38.4% ක් විය.
(5) 42.2% ක් සහ 30.0% ක් විය.

**35.** පහත සඳහන් ඒ අතුරින් සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්තියක් ලෙස සැලකිය හැක්කේ කවරක් ද?

(1) ආණ්ඩුවේ අයවැය හිඟය අඩු කිරීම
(2) ආයෝජනය දිරිමත් කිරීමට ව්‍යාපාර සඳහා ආයෝජන බදු සහන ලබා දීම
(3) ආනයන භාණ්ඩ මත තීරු බදු පැනවීම
(4) පෞද්ගලික හිමිකම සහිත ව්‍යාපාර රාජ්‍ය අංශය වෙත පැවරීම
(5) සමාහාර වියදමේ ඉහළ යාමක් ඇතිවන අන්දමින් ආණ්ඩුවේ වියදම් ඉහළ නැංවීම

**36.** A හා B රටවල් දෙකට අදාළ නිෂ්පාදන හැකියා වක්‍ර පහත රූපසටහන පෙන්නුම් කරයි. A රටට රබර් ටොන් මිලියන 100ක් හෝ කුරුඳු ටොන් මිලියන 50ක් හෝ නිෂ්පාදනය කළ හැකි ය. B රටට රබර් ටොන් මිලියන 200ක් හෝ කුරුඳු ටොන් මිලියන 100ක් හෝ නිෂ්පාදනය කළ හැකි ය.




සාපේක්ෂ වාසි න්‍යායට අනුව

(1) විශේෂ ප්‍රාගුණ්‍යනය කිරීමෙන් රටවල් දෙකට ම ප්‍රතිලාභ ලැබිය හැකි වේ.
(2) කුරුඳු නිෂ්පාදනයේ දී A රටට වඩා B රටෙහි ආවස්ථික පිරිවැය වැඩි වේ.
(3) කුරුඳු නිෂ්පාදනයේ දී B රටට වඩා A රටෙහි ආවස්ථික පිරිවැය වැඩි වේ.
(4) B රට A රටට කුරුඳු අපනයනය කරයි.
(5) A රට සහ B රට අතර වෙළෙඳාමක් සිදුවිය නොහැකි ය.

**37.** ශ්‍රී ලංකාවේ ආනයන සංයුතියේ වර්තමාන තත්ත්වය නිවැරදිව පෙන්නුම් කෙරෙනුයේ පහත සඳහන් කවර වරණයෙහි ද?

| | පාරිභෝගික භාණ්ඩ | අතරමැදි භාණ්ඩ | ආයෝජන භාණ්ඩ |
|---|---|---|---|
| (1) | 20% | 57% | 23% |
| (2) | 22% | 60% | 18% |
| (3) | 24% | 45% | 31% |
| (4) | 25% | 51% | 24% |
| (5) | 28% | 49% | 23% |

**38.** පහත සඳහන් වගුව කිසියම් රටක සය අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා වාර්තා වූ අපනයන මිල දර්ශකය සහ ආනයන මිල දර්ශකය පෙන්නුම් කරයි.

| අවුරුද්ද | අපනයන මිල දර්ශකය | ආනයන මිල දර්ශකය |
|---|---|---|
| 1 | 100 | 100 |
| 2 | 105 | 108 |
| 3 | 112 | 110 |

| අවුරුද්ද | අපනයන මිල දර්ශකය | ආනයන මිල දර්ශකය |
|---|---|---|
| 4 | 116 | 120 |
| 5 | 129 | 129 |
| 6 | 150 | 130 |

ප්‍රථම වර්ෂයට සාපේක්ෂව වෙළෙඳ අනුපාතය වඩා වාසිදායක වූයේ කවර වර්ෂයේදී ද?

(1) 2වන වර්ෂය (2) 3වන වර්ෂය (3) 4වන වර්ෂය
(4) 5වන වර්ෂය (5) 6වන වර්ෂය

**39.** ශ්‍රී ලාංකික ආයෝජකයෙකු විසින් ජපාන නිෂ්පාදන සමාගමක ඩොලර් මිලියන 10ක් වටිනා කොටස් මිල දී ගනු ලැබුවේ යැයි සලකන්න. මෙම ගනුදෙනුව ද්විත්ව සටහන් මූලධර්මයට අනුව ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ වාර්තා කරනුයේ කෙසේ ද?

| | හර | බැර |
|---|---|---|
| (1) | ප්‍රාග්ධන ගිණුම | ප්‍රාථමික ආදායම් ගිණුම |
| (2) | වෙනත් ආයෝජන ගිණුම | කළඹ ආයෝජන ගිණුම |
| (3) | කළඹ ආයෝජන ගිණුම | වෙනත් ආයෝජන ගිණුම |
| (4) | මූල්‍ය ව්‍යුත්පන්න ගිණුම | ඍජු ආයෝජන ගිණුම |
| (5) | ප්‍රාග්ධන ගිණුම | කළඹ ආයෝජන ගිණුම |

**40.** කිසියම් රටක ගෙවුම් ශේෂ ලේඛනයකින් තෝරාගනු ලැබූ දත්ත කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| අයිතමය | රුපියල් බිලියන |
|---|---|
| අපනයන (භාණ්ඩ) | 600 |
| ආනයන (භාණ්ඩ) | 800 |
| සේවා (ශුද්ධ) | 30 |
| ප්‍රාථමික ආදායම (ශුද්ධ) | –80 |
| ද්විතීයික ආදායම (ශුද්ධ) | 150 |
| ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ) | 60 |

වගුවේ දක්වා ඇති තොරතුරුවලට අනුව, මෙම රටේ ගෙවුම් ශේෂ තත්ත්වය පිළිබඳව පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?

(1) රුපියල් බිලියන 180ක වෙළෙඳ ශේෂ හිඟයක් පවතී.
(2) රුපියල් බිලියන 140ක ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම් අතිරික්තයක් පවතී.
(3) රුපියල් බිලියන 100ක අතිරික්තයක් ජංගම ගිණුමෙහි පවතී.
(4) රුපියල් බිලියන 40ක හිඟයක් මූල්‍ය ගිණුමෙහි පවතී.
(5) රුපියල් බිලියන 40ක අතිරික්තයක් මූල්‍ය ගිණුමෙහි පවතී.

**41.** මාර්ෂල්-ලර්නර් කොන්දේසියට අනුව, විනිමය අනුපාතිකයේ ක්ෂයවීමකින් පසු ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම වැඩි දියුණු විය හැක්කේ පහත සඳහන් කවර තත්ත්වයක් යටතේ ද?

(1) ආනයන මිල නම්‍යතාව = – 0.6 සහ අපනයන මිල නම්‍යතාව = – 0.4
(2) ආනයන මිල නම්‍යතාව = – 0.8 සහ අපනයන මිල නම්‍යතාව = – 0.7
(3) ආනයන මිල නම්‍යතාව = – 0.3 සහ අපනයන මිල නම්‍යතාව = – 0.5
(4) ආනයන මිල නම්‍යතාව = – 0.4 සහ අපනයන මිල නම්‍යතාව = – 0.2
(5) ආනයන මිල නම්‍යතාව = – 0.6 සහ අපනයන මිල නම්‍යතාව = – 0.3

**42.** පාවෙන (නම්‍ය) විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ,

(1) ගෙවුම් ශේෂය සැමවිට ම අතිරික්තයක් වේ.
(2) ගෙවුම් ශේෂය සැමවිට ම හිඟයක් වේ.
(3) ආර්ථිකය මුළුමනින් ම බාහිර බලපෑම්වලින් ආරක්ෂිත වේ.
(4) විදේශ විනිමය සඳහා ඇති ඉල්ලුම හා සැපයුම සමාන කිරීමට විනිමය අනුපාතිකය හැඩගැසිය යුතු වේ.
(5) විනිමය අනුපාතිකය තීරණය වීම කෙරෙහි බලපෑම් කිරීමට රජය මැදිහත් වේ.

**43.** වේගවත් ආර්ථික වෘද්ධි අනුපාතික අත්කර ගැනීම සඳහා දායක විය හැක්කේ පහත සඳහන් කවරකට ද?

(1) වඩාත් සීඝ්‍රයෙන් ස්වභාවික සම්පත් පරිභෝජනය කිරීම
(2) ආරක්ෂණවාදී වෙළෙඳ ප්‍රතිපත්ති
(3) පර්යේෂණ හා සංවර්ධනය සඳහා රජයේ අරමුදල් වැඩි කිරීම
(4) පාරිභෝගික සහනාධාර ඉහළ නැංවීම
(5) කුටුම්බ සහ ආයතන මත ඉහළ බදු පැනවීම

**44.** මානව සංවර්ධන දර්ශකය තුළට හසුකොට ගනු ලැබ ඇති ප්‍රධාන සමාජ ආර්ථික පැතිකඩවල් වනුයේ,

(1) දීර්ඝ සහ නිරෝගී ජීවිතයක්, අධ්‍යාපනය සහ යහපත් ජීවන මට්ටමක් ය.
(2) ආයු කාලය, වැඩිහිටි සාක්ෂරතාව සහ ප්‍රති ශීර්ෂ ආදායම ය.
(3) පරිගණක සාක්ෂරතාව, සේවා නියුක්ති අනුපාතිකය සහ දරිද්‍රතා මට්ටම ය.
(4) කැලරි පරිභෝජනය, ආදායම් අසමානතාව සහ මානව සම්පත් සංවර්ධනය ය.
(5) ස්ත්‍රී පුරුෂ සාමානාත්මතාව, පරිගණක සාක්ෂරතාව සහ ආහාර සුරක්ෂිතතාව ය.

**45.** 2010 සහ 2020 යන වර්ෂවල දී කිසියම් රටක ආදායම් ලබන්නන්ගේ ආදායම් පංගු, පංචමක අනුව පහත වගුවෙහි දැක්වේ.

| වර්ෂය | 1වන පංචමකය | 2වන පංචමකය | 3වන පංචමකය | 4වන පංචමකය | 5 වන පංචමකය |
|---|---|---|---|---|---|
| 2010 | 5% | 10% | 15% | 25% | 45% |
| 2020 | 4% | 8% | 12% | 26% | 50% |

මෙම වගුවට අනුව නිගමනය කළ හැක්කේ ගත වූ දස වසර තුළ
(1) රටේ සම්පත් බෙදා වෙන්කිරීමේ දියුණුවක් හටගෙන ඇති බව ය.
(2) ආදායම් බෙදීයාම වඩාත් අසමාන වී ඇති බව ය.
(3) ධනය බෙදීයාම වඩාත් අසමාන වී ඇති බව ය.
(4) අඩු ආදායම් ලබන්නන්ගේ ආර්ථික තත්ත්වය උසස් වී ඇති බව ය.
(5) අඩු ආදායම් ලබන්නන්ගේ ඵලදායිතාව පහළ වැටී ඇති බව ය.

**46.** වදන් සැකසුම් (word processing) ක්ෂේත්‍රය පරිගණක ආධිපත්‍යයට නතුවීමත් සමග පරිගණක නිපුණතාව නොමැති ඇතැම් යතුරුලියන ක්‍රියාකරුවන්ට ඔවුන්ගේ රැකියා අහිමි විය. මෙය පහත සඳහන් කවර විරැකියා තත්ත්වයකට උදාහරණයක් වේ ද?
(1) ඝර්ෂික සේවා වියුක්තිය
(2) සැඟවුණු සේවා වියුක්තිය
(3) ව්‍යුහමය සේවා වියුක්තිය
(4) වාරික සේවා වියුක්තිය
(5) චක්‍රීය සේවා වියුක්තිය

**47.** තිරසාර සංවර්ධනය යටතේ ආවරණය කෙරෙන ප්‍රධාන ක්ෂේත්‍ර තුන වනුයේ,
(1) පරිසරය, ආර්ථිකය සහ සමාජයයි.
(2) පරිසරය, ආර්ථිකය සහ සාධාරණත්වයයි.
(3) පරිසරය, කුසගින්න සහ සමාජයයි.
(4) පරිසරය, සාමය සහ දරිද්‍රතාවයයි.
(5) පරිසරය, හවුල්කාරිත්වය සහ සමාජයයි.

**48.** පහත දැක්වෙන වගුවෙහි කල්පිත ආර්ථිකයක ශ්‍රම වෙළෙඳපොළ තත්ත්වය සාරාංශකොට දැක්වේ.

| වර්ෂය | වැඩකරන වයසේ ජනගහනය (මිලියන) | සේවා නියුක්ත ජනගහනය (මිලියන) | සේවා වියුක්ත ජනගහනය (මිලියන) |
|---|---|---|---|
| 2018 | 50 | 24 | 6 |
| 2020 | 60 | 32 | 8 |

මෙම තොරතුරුවලට අනුව පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?
(1) 2018 සිට 2020 දක්වා සේවා වියුක්ති අනුපාතිකය ඉහළ ගොස් ඇත.
(2) 2018 සිට 2020 දක්වා සේවා වියුක්ති අනුපාතිකය පහළ වැටී ඇත.
(3) 2018 සිට 2020 දක්වා ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය 60% සිට 67%ක් දක්වා වැඩි වී තිබේ.
(4) 2018 සිට 2020 දක්වා ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය පහළ වැටී ඇත.
(5) 2018 සිට 2020 දක්වා ජනගහනය වර්ධනය වී ඇති නමුදු ශ්‍රම හමුදාව නොවෙනස්ව පැවතී ඇත.

**49.** රටවල් පිළිබඳ ආර්ථික වර්ගීකරණයට අනුව, ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් රටක තත්ත්වයට පත් කරනු ලැබුවේ කවර වර්ෂයේ දී ද?
(1) 2016 (2) 2017 (3) 2018 (4) 2019 (5) 2020

**50.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ අතිශයින් පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් තුන වනුයේ,
(1) ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ලොතරැයි මණ්ඩලය සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවයි.
(2) සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාවයි.
(3) සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සීමාසහිත ලංකා සතොසයි.
(4) ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ රාජ්‍ය ඖෂධ සංස්ථාවයි.
(5) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ සීමාසහිත ලංකා සීනි සමාගමයි.

* * *

69034



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

21 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

* 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

* ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**1.** (i) නිෂ්පාදන සාධකයක් වශයෙන් 'භූමියෙහි' ආර්ථික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(ii) "නගරයක් ආසන්නයේ පිහිටි අක්කර 500ක ඉඩමක් වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂ රාශියකගේ නිවාස ස්ථානයක් වන බැවින්, එය ස්වභාවික තත්ත්වයෙන්ම රැකගත යුතු යැයි පරිසර අධිකාරිය අදහස් කරයි. නාගරික සංවර්ධන අධිකාරිය එම ඉඩමෙහි නාගරික නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම් කර ඇත."

මෙම සිද්ධිය හා සම්බන්ධ **හිඟකම, තේරීම** සහ **ආවස්ථික පිරිවැය** පිළිබඳ මූලිකාංග හඳුනාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 02 × 3 = 06යි)

(iii) නිෂ්පාදන හැකියා වක්‍රයක් සෘණ බෑවුමක් සහිත වන්නේ සහ පිටතට නෙරා යන්නේ ඇයි? (ලකුණු 04යි)

(iv) (a) මිශ්‍ර ආර්ථික ක්‍රමය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(b) 'ශ්‍රී ලංකාව මිශ්‍ර ආර්ථිකයක් වේ' යන අදහස තහවුරු කෙරෙන ආර්ථික ක්‍රියාකාරකම් සඳහා නිදසුන් **හතරක්** සපයන්න. (ලකුණු 04යි)

**2.** (i) ඉල්ලුම් නීතියට පටහැනි වියහැකි අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(ii) පෙට්‍රොල් ලීටරයක් රු. 140ක් වන විට ලීටර් 22ක් මිලට ගන්නා පාරිභෝගිකයෙක් ලීටරයක මිල රු.160කට ඉහළ ගිය විට ලීටර් 18ක් මිල දී ගන්නා බව සලකන්න. මෙම පාරිභෝගිකයාගේ ඉල්ලුමේ මිල නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 04යි)

(iii) අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී, බාල භාණ්ඩයක මිල පහළ වැටේ නම් එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩුවේ ද? වැඩි වේ ද? ආදේශන සහ ආදායම් ප්‍රතිවිපාක කෙරෙහි අවධානය යොමු කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) සැපයුම් වක්‍රය විතැන් කිරීමට හේතුවන සාධක **තුනක්** රූපසටහන් ආධාර කරගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

[දෙවැනි පිටුව බලන්න

**3.** (i) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය නිර්වචනය කරන්න. (ලකුණු 04යි)

(ii) උපරිම මිලක් නිසා සුබසාධනය අහිමිවීමක් (deadweight loss) හටගන්නේ කෙසේ දැයි රූපසටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) රජය විසින් එළඟු වගා කරන ගොවීන්ට කිලෝග්‍රෑමයක් සඳහා රු.100ක මිල ආධාරකයක් ලබා දී ඇති අතර අතිරික්ත සැපයුම ආධාරක මිල යටතේ රජය විසින් මිල දී ගන්නා බවත් සලකන්න. වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

ඉල්ලුම: $Q_D = 240 - 2P$ සැපයුම: $Q_S = -210 + 3P$

(a) මෙම මිල ආධාරක වැඩසටහන සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණ ද? (ලකුණු 04යි)

(b) මිල ආධාරකයට පසුව පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය කොතරම් ප්‍රමාණයක් වේ ද? (ලකුණු 04යි)

(c) මිල ආධාරකය නිසා අහිමි වන සුබසාධනය ගණනය කරන්න. (ලකුණු 04යි)

**4.** (i) 'ප්‍රාමාණික ලාභය' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ii) පහත දැක්වෙන වියදම් ස්ථාවර පිරිවැය සහ විචල්‍ය පිරිවැය වශයෙන් වර්ගීකරණය කරන්න.

(a) අමුද්‍රව්‍ය

(b) කර්මාන්තශාලා ගොඩනැගිලි සඳහා බදු කුලිය

(c) ලබාගත් ණය මුදල් සඳහා පොලී

(d) පොහොර (ලකුණු 01 × 4 = 04යි)

(iii) ඒකාධිකාරය සමග පූර්ණ තරගකාරී වෙළෙඳපොළ ව්‍යුහය සංසන්දනය කරන්න. (ලකුණු 04යි)

(iv) "ආයතන කෙටි කාලයේ දී පාඩු ලබමින් වුව ද කර්මාන්තය තුළ රැඳී සිටීමට පිළිවන." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) "මසකට රු. 200 000ක වැටුපක් ලබමින් සිටි පරිගණක මෘදුකාංග ඉංජිනේරුවරියක, ව්‍යවසායිකාවක වීමට තීරණය කොට, තමන්ගේම මෘදුකාංග සංවර්ධන ආයතනයක් ආරම්භ කරමින්, ව්‍යවසායිකාවක වූ අතර, ඇය එම ආයතනයෙන් මසකට රු. 500 000ක් උපයයි."

(a) මෙම ව්‍යවසායිකාවගේ සංක්‍රාම ඉපයීම කොපමණ ද? (ලකුණු 03යි)

(b) මෙම ව්‍යවසායිකාව ආර්ථික බදු කුලියක් උපයන්නේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

**5.** (i) පහත දැක්වෙන ඒකක, ජාතික ආදායම් ගිණුම්කරණයේ දී කවර ආයතනික අංශවලට අයත්වේ දැයි සඳහන් කරන්න.

(a) ධීවර කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය

(b) දකුණු පළාත් සභාව

(c) ජාතික වාණිජ මණ්ඩලය

(d) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (ලකුණු 01 × 4 = 04යි)

(ii) කිසියම් විවෘත ආර්ථිකයක් සඳහා පහත සඳහන් සාර්ව ආර්ථික දත්ත සැලකිල්ලට ගන්න.

| | | |
|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය (Y) | = | 500 |
| පරිභෝජනය (C) | = | 350 |
| බදු – සංක්‍රාම (ශුද්ධ බදු) | = | 20 |
| ආයෝජනය (I) | = | 150 |
| අයවැය හිඟය | = | 120 (සියලුම අගයන් රුපියල් බිලියනවලිනි) |

මෙම ආර්ථිකයේ ශුද්ධ අපනයන අගය කොපමණ වේ ද? (ලකුණු 04යි)

(iii) කල්පිත සංවෘත ආර්ථිකයක සමතුලිත ජාතික ආදායම රු. බිලියන 800ක් ද, ආන්තික පරිභෝජන නැඹියාව (MPC) 0.8ක් ද, විභව නිමැවුම් මට්ටම රු. බිලියන 1 000ක් ද වේ යැයි සලකන්න.

(a) මෙම ආර්ථිකය මුහුණ දෙමින් සිටිනුයේ ප්‍රතිගමනාත්මක පරතරයකට ද නැතහොත් උද්ධමනාත්මක පරතරයකට ද? එම පරතරයේ ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02යි)

(b) රජය විසින් සෘජු බදු යොදාගනිමින් මෙම පරතරය ඉවත් කිරීමට අදහස් කරන්නේ නම්, සෘජු බදු කොතරම් ප්‍රමාණයකින් වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ ද? (ලකුණු 02යි)

(iv) රටක ජාතික ගිණුම්වලට අදාළ දත්ත කිහිපයක් පහත වගුවෙහි දැක්වේ.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|
| මූලික මිල යටතේ දළ එකතු කළ අගය | 11 500 |
| අවශේෂ ලෝකයෙන් ලැබුණු ශුද්ධ ප්‍රාථමික ආදායම | – 300 |
| නිෂ්පාදිත මත සහනාධාර අඩු කළ බදු | 800 |
| පරිභෝජන වියදම | 8 500 |
| අවශේෂ ලෝකයෙන් ලැබුණු ශුද්ධ වර්තන සංක්‍රාම | 900 |

ඉහත දත්ත පදනම් කරගනිමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(a) දළ දේශීය නිෂ්පාදිතය

(b) දළ ජාතික ආදායම

(c) වැය කළ හැකි දළ ජාතික ආදායම

(d) දේශීය ඉතුරුම් (ලකුණු 02 × 4 = 08යි)

## 'ආ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

6. (i) මුදලේ ප්‍රධාන කාර්යයන් කවරේ ද? (ලකුණු 04යි)

(ii) බැංකු පද්ධතියේ මුදල් මැවීමේ විභවතාව කෙරෙහි බල පෑ හැකි සාධක මොනවා ද? (ලකුණු 04යි)

(iii) පරස්පර අරමුණු දෙකක් ලුහුබැඳයාමේ දී වාණිජ බැංකුවක් තම වත්කම් ව්‍යුහය කළමනාකරණය කරගන්නේ කෙසේ ද? (ලකුණු 06යි)

(iv) කෝවිඩ් - 19 වසංගතය නිසා කුටුම්බ හා ව්‍යාපාර ආයතන මුහුණ පා සිටින මූල්‍ය අසහනය විසඳීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කළ මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ කවරේ ද? (ලකුණු 06යි)

7. (i) වෙළෙඳපොළ ආර්ථිකයක ඇතැම් භාණ්ඩ හා සේවා අධි පරිභෝජනයක් සහ ඇතැම් ඒවා ඌන පරිභෝජනයක් සිදුවන්නේ ඇයි? (ලකුණු 04යි)

(ii) ශුද්ධ පෞද්ගලික භාණ්ඩ හා ශුද්ධ පොදු භාණ්ඩ අතර ඇති ප්‍රධාන වෙනස්කම් කැටිකොට දක්වන්න. (ලකුණු 04යි)

(iii) පෞද්ගලීකරණයට පක්ෂව තර්ක **දෙකක්** සහ පෞද්ගලීකරණයට විපක්ෂව තර්ක **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iv) අයවැය හිඟය පුළුල්වීමේ ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

**8.** (i) සමාන සම්පත් ප්‍රමාණයකින් A නමැති රටට මෝටර් රථ 40ක් හෝ ආහාර ටොන් 40ක් හෝ නිපදවිය හැකි බවත් B නමැති රටට මෝටර් රථ 60ක් හෝ ආහාර ටොන් 30ක් හෝ නිපදවිය හැකි බවත් සලකන්න.

(a) විශේෂ ප්‍රාගුණ්‍යනයක් නොමැති විට එක් එක් රටෙහි අභ්‍යන්තර හුවමාරු අනුපාතිකය කවරක් ද? (ලකුණු 02යි)

(b) ඉහත භාණ්ඩ නිෂ්පාදනය කිරීමෙහි ලා මෙම රටවල සාපේක්ෂ වාසි දක්නට ලැබේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) ගෙවුම් ශේෂ ලේඛනයක ශුද්ධ අපනයන සහ ජංගම ගිණුමේ ශේෂය අතර වෙනස කවරක් ද? (ලකුණු 04යි)

(iii) විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඉල්ලුම් හා සැපයුම් වක්‍ර විතැන්වීමට බලපාන ප්‍රධාන සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iv) පහත දැක්වෙන විනිමය අනුපාතික ක්‍රම යටතේ මහ බැංකුවේ කාර්යභාරය කුමක් ද?

(a) ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය (ලකුණු 03යි)

(b) පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය (ලකුණු 03යි)

**9.** (i) ආර්ථික වෘද්ධිය යනු කුමක් ද? ආර්ථික වෘද්ධි අනුපාතිකයෙන් එය වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

(ii) "සංවර්ධනය වූ කලී බහුමාන ක්‍රියාවලියකි." පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) වර්තමාන ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ ආංශික සංයුතිය (කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා), දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සමග සසඳන්න. (ලකුණු 06යි)

(iv) ආයෝජකයන්ට මගපෙන්වන පහත දැක්වෙන ප්‍රධාන දර්ශකයන්ට අනුව ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය කුමක් ද?

(a) ව්‍යාපාර කරගෙන යාමේ පහසුව පිළිබඳ දර්ශකය (Ease of Doing Business Index) (ලකුණු 02යි)

(b) ගෝලීය තරගකාරිත්ව දර්ශකය (Global Competitiveness Index) (ලකුණු 02යි)

(c) දූෂණ සංජානන දර්ශකය (Corruption Perception Index) (ලකුණු 02යි)

**10.** (i) ව්‍යාවහාර මුදල් හුවමාරු ගිවිසුමක් (currency swap agreement) යනු කවරක් ද? ශ්‍රී ලංකාව ඇසුරෙන් නිදසුනක් දක්වන්න. (ලකුණු 04යි)

(ii) ආයෝජක විශ්වාසනීයත්වයට සහ තරගකාරීත්වයට බාධා කෙරෙන ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ගැටලුකාරී ක්ෂේත්‍ර සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) ශ්‍රී ලංකා ආර්ථිකය වර්තමානයේ මුහුණ පා සිටින විදේශ විනිමය අර්බුදය විසඳා ගැනීම සඳහා ඔබට යෝජනා කළහැකි ප්‍රතිපත්ති නිර්දේශ කවරේද? (ලකුණු 04යි)

(iv) මෑත වර්ෂවල **ආර්ථික වෘද්ධි අනුපාතිකය**, **අයවැය හිඟය**, **වෙළෙඳ හිඟය** සහ **රාජ්‍ය ණය** යන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකා ආර්ථිකය පෙන්නුම් කළ **කාර්යසාධනය** යෝග්‍ය දත්ත යොදාගනිමින් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 08යි)

* * *

PAST PAPERS WIKI

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப்பரீட்சை - 2021 (2022)

විෂයය අංකය / பாட இலக்கம் **21**     විෂයය / பாடம் **ආර්ථික විද්‍යාව**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 4 | 21. | 5 | 31. | 1 | 41. | 2 |
| 02. | 4 | 12. | 1 | 22. | 4 | 32. | 4 | 42. | 4 |
| 03. | 4 | 13. | 4 | 23. | 5 | 33. | 2 | 43. | 3 |
| 04. | 5 | 14. | 4 | 24. | 4 | 34. | 1 | 44. | 1 |
| 05. | 3 | 15. | 1 | 25. | 3 | 35. | 2 | 45. | 2 |
| 06. | 2 | 16. | 3 | 26. | 1 | 36. | 5 | 46. | 3 |
| 07. | 1 | 17. | 5 | 27. | 4 | 37. | 1 | 47. | 1 |
| 08. | 4 | 18. | 5 | 28. | 3 | 38. | 5 | 48. | 3 |
| 09. | 5 | 19. | 2 | 29. | 4 | 39. | 3 | 49. | 4 |
| 10. | 2 | 20. | 2 | 30. | 5 | 40 | 5 | 50 | 2 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 01 × 50 = 50

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

**21 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

※ 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 01 වන ප්‍රශ්නය

### 'අ' උප කොටස

**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

1. (i) නිෂ්පාදන සාධකයක් වශයෙන් 'භූමියෙහි' ආර්ථික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(ii) "නගරයක් ආසන්නයේ පිහිටි අක්කර 500ක ඉඩමක් වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂ රාශියකගේ නිවාස ස්ථානයක් වන බැවින්, එය ස්වභාවික තත්ත්වයෙන්ම රැකගත යුතු යැයි පරිසර අධිකාරිය අදහස් කරයි. නාගරික සංවර්ධන අධිකාරිය එම ඉඩමෙහි නාගරික නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම් කර ඇත."

මෙම සිද්ධිය හා සම්බන්ධ **හිඟකම**, **තේරීම** සහ **ආවස්ථික පිරිවැය** පිළිබඳ මූලිකාංග හඳුනාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 02 × 3 = 06යි)

(iii) නිෂ්පාදන හැකියා වක්‍රයක් සෘණ බෑවුමක් සහිත වන්නේ සහ පිටතට නෙරා යන්නේ ඇයි? (ලකුණු 04යි)

(iv) (a) මිශ්‍ර ආර්ථික ක්‍රමය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(b) 'ශ්‍රී ලංකාව මිශ්‍ර ආර්ථිකයක් වේ' යන අදහස තහවුරු කෙරෙන ආර්ථික ක්‍රියාකාරකම් සඳහා නිදසුන් **හතරක්** සපයන්න. (ලකුණු 04යි)

01. (i)
- භූමියේ සැපයුම ස්ථාවරය : භූමියට ගෙවනු ලබන මිල වැඩි කරනු ලැබුව ද එහි සැපයුම වැඩි නොවේ.
- භූමියේ සැපයුම සඳහා පිරිවැයක් දැරීමට සමාජයට සිදු නොවේ.
- භූමිය ස්වභාව ධර්මය විසින් සමාජයට ප්‍රදානය කොට ඇති දායාදයකි.
- භූමිය සුවිශේෂී සාධකයක් නොවේ : එහි විකල්ප භාවිත ඇත. විවිධ අරමුණු සඳහා යොදාගත හැකිය.
- භූමිය අචල (immovable) සාධකයකි. : එය එක් තැනකින් තවත් තැනකට ප්‍රවාහනය කළ නොහැකිය.
- භූමිය ප්‍රාථමික නිෂ්පාදන සාධකයක් (Primary factor of Production) වේ. : එය නිෂ්පාදනය කරන භාණ්ඩයේ කොටසක් බවට පත් නොවේ. නිෂ්පාදන ක්‍රියාවලිය තුළ අතුරුදහන්ව නොයයි.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි.)**

(ii) - නාගරික ප්‍රදේශයක පිහිටි අක්කර 500 බිම් කැබැල්ලක් විකල්ප භාවිත සඳහා යොදා ගැනීමට විශාල ඉල්ලුමක් පවතී, එම භූමිය ස්වාභාවික තත්ත්වයෙන්ම රැක ගැනීමේ අවශ්‍යතාව පරිසර අධිකාරියට ඇති අතර නාගරික සංවර්ධන අධිකාරිය එහි නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට අපේක්ෂා කරයි. විකල්ප භාවිත ඇති මෙම ඉඩම හිඟ සම්පතක් වේ. (ලකුණු 02 යි)

- විකල්ප භාවිත සහිත හිඟ සම්පතක් වන බැවින් භූමිය කවර භාවිතයක් සඳහා යොදා ගත යුතු දැයි තේරීමක් කිරීමට සිදුවේ. මක්නිසාදයත් එක්වර භාවිත දෙක සඳහාම සීමිත බිම් කොටස යොදා ගත නොහැකි බැවිනි. එබැවින් ස්වභාවික තත්ත්වයක් භූමිය බිම් ප්‍රදේශය පවත්වාගෙන යනවාද නැතහොත් නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට යොදා ගන්නවාද යන්න අතර තේරීමක් කිරීමට සිදුවේ. (ලකුණු 02 යි)

- තේරීමක් කිරීමේ දී අවශ්‍යයෙන්ම කැපකිරීමක් ද හටගනී. එක් දෙයක් ලබා ගැනීමේ දී තවත් දෙයක් අත්හැරීමට සිදුවේ. එය තේරීමේ ආවස්ථික පිරිවැය වේ. මෙහි දී භූමිය ස්වාභාවික තත්ත්වයෙන්ම රැක ගැනීමේ ආවස්ථික පිරිවැය වනුයේ නිවාස ඉදිකිරීම සඳහා භූමිය අහිමි වී යාමයි. නිවාස ඉදිකිරීමට භූමිය යොදාගැනීමේ ආවස්ථික පිරිවැය වනුයේ වඳවීයාමේ තර්ජනයට ලක්ව ඇති සතුන් සඳහා භූමිය අහිමි වී යාමයි.

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 06 යි)

(iii) - නිෂ්පාදන හැකියා වක්‍රයක් සෘණ බෑවුමක් සහිත වීම පිළිබිඹු කරනුයේ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැයයි. එක් භාණ්ඩයක් වැඩියෙන් නිෂ්පාදනය කිරීම සඳහා තවත් භාණ්ඩයක නිෂ්පාදනය අඩුකර ගැනීමට සිදුවේ. (ලකුණු 01 යි)

- නිෂ්පාදන හැකියා වක්‍රයක් පිටතට නෙරායනුයේ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය ක්‍රමයෙන් ඉහළ නගින නිසාය. නිෂ්පාදන හැකියා වක්‍රය මත එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ඒකක වලින් ක්‍රමයෙන් වැඩි කරන විට ඒ වෙනුවෙන් කැපකිරීමට සිදුවන අනික් භාණ්ඩයේ නිෂ්පාදනය ක්‍රම ක්‍රමයෙන් වැඩිවන ඒකක ප්‍රමාණයකින් පහළ දැමීමට සිදුවේ. එනම් ආවස්ථික පිරිවැය ක්‍රම ක්‍රමයෙන් ඉහළ යයි.

(ලකුණු 01 යි)

- ආවස්ථික පිරිවැය ක්‍රමයෙන් ඉහළ යාමට බලපාන හේතු තුනකි :
  (a) නිෂ්පාදන සම්පත් සමජාතීය නොවීම.
  (b) විවිධ භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදා ගැනෙන ශිල්ප ක්‍රම වෙනස්වීම.
  (c) කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් නිපදවීම සඳහා වඩාත් යෝග්‍ය සාධකයන් වෙනස් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීමේ දී එතරම් යෝග්‍ය නොවීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)

(මුළු ලකුණු 04 යි)

(iv) (a) - මිශ්‍ර ආර්ථික ක්‍රමයක් යනු මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා වෙළෙඳපොළ ආර්ථික පද්ධති සහ විධාන ආර්ථික පද්ධතියක ලක්ෂණ සම්මිශ්‍රණය කොට ඇති කරගෙන තිබෙන ආර්ථික ක්‍රමයයි. ධනේෂ්වර සහ සමාජවාදී ආර්ථික පද්ධතිවල සම්මිශ්‍රණයක් ලෙස ද එය සැලකිය හැකිය.

(ලකුණු 01 යි)

- මිශ්‍ර ආර්ථික ක්‍රමයක් තුළ රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එවැනි ආර්ථිකයක් පෞද්ගලික දේපළ ආරක්ෂා කරන අතර ප්‍රාග්ධනය භාවිතා කිරීමේ දී ආර්ථික නිදහසක් ද හිමිකර දී ඇත. එසේම සමාජයීය අභිලාශයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ආර්ථික කටයුතු වලට රජය මැදිහත්වීම් ද කරනු ලැබේ. සැබෑ ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබෙනුයේ මිශ්‍ර ආර්ථික ක්‍රමයන් ය.

(ලකුණු 01)

(b)
- සම්පත් පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික හිමිකාරිත්වය
- රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායන් ක්‍රියාත්මක වීම
- පෞද්ගලික දේපළ ආරක්ෂා කිරීම
- පෞද්ගලික අංශය නියාමනය කිරීම
- ඉල්ලුම හා සැපයුම මත මිල ගණන් නිදහසේ තීරණය වීමට ඉඩ හැරීම. (මිල යාන්ත්‍රණය)
- ආදායම් විෂමතා පාලනය කිරීමට රජය මැදිහත් වීම
- යටිතල පහසුකම් හා වෙනත් පහසුකම් සපයා දෙමින් රජය පෞද්ගලික අංශය ධෛර්යමත් කිරීම
- බදු අයකිරීම සහ රජය වියදම් කිරීම (රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය)

**(එක් ක්‍රියාකාරකමකට ලකුණු 01 බැගින් ඕනෑම ක්‍රියාකාරකම් හතරකට ලකුණු 04 යි)**

**(ලක්ෂ්‍ය නම්‍යතා සූත්‍රය යොදා ගණනය කිරීමට ලකුණු නොලැබේ.)**

**02 වන ප්‍රශ්නය**

2. (i) ඉල්ලුම් නීතියට පටහැනි වියහැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(ii) පෙට්‍රෝල් ලීටරයක් රු. 140ක් වන විට ලීටර් 22ක් මිලට ගන්නා පාරිභෝගිකයෙක් ලීටරයක මිල රු. 160කට ඉහළ ගිය විට ලීටර් 18ක් මිල දී ගන්නා බව සලකන්න. මෙම පාරිභෝගිකයාගේ ඉල්ලුමේ මිල නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 04යි)

(iii) අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී, බාල භාණ්ඩයක මිල පහළ වැටේ නම් එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩුවේ ද? වැඩි වේ ද? ආදේශන සහ ආදායම් ප්‍රතිවිපාක කෙරෙහි අවධානය යොමු කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) සැපයුම් වක්‍රය විතැන් කිරීමට හේතුවන සාධක තුනක් රූපසටහන් ආධාර කරගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

02. (i)
- ප්‍රදර්ශනාත්මක/ ජේත්තුකාර පරිභෝජනයට අදාළ භාණ්ඩ (වෙබ්ලින් භාණ්ඩ)
- ගිෆන් භාණ්ඩ
- භාණ්ඩයේ ගුණාත්මක තත්ත්වය මිල මගින් තීරණය කරන අවස්ථා

**(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 04 යි)**

(ii)
- අදාළ නම්‍යතා සූත්‍රය චාප නම්‍යතා සූත්‍රය නැතහොත් මධ්‍ය ලක්ෂ්‍ය නම්‍යතා සූත්‍රයයි.
- චාප නම්‍යතාව $= \frac{\Delta Q}{\Delta P} \times \frac{P_1 + P_2}{Q_1 + Q_2}$ (ලකුණු 01 යි)

$= \frac{4}{20} \times \frac{140 + 160}{22 + 18}$ (ලකුණු 01 යි)

$= \frac{4}{20} \times \frac{300}{40} = -\frac{3}{2} = -1.5$ (ලකුණු 02 යි)

(iii) - අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී බාල භාණ්ඩයක මිල පහළ වැටේ නම් එම භාණ්ඩයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වේ.

- මෙහිදී බාල භාණ්ඩයේ සාපේක්ෂ මිල පහළ බසින නිසා ආදේශන ප්‍රතිවිපාකය ඔස්සේ භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වේ.

- ආදේශන ප්‍රතිවිපාකය සෑම විටම භාණ්ඩයේ සාපේක්ෂ මිල වෙනස්වීම සමග ප්‍රතිලෝම සම්බන්ධයක් පෙන්නුම් කරන බැවින් සාපේක්ෂ මිල අඩු වූ විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වේ. (ලකුණු 02 යි)

- බාල භාණ්ඩයක මිල පහළ ගිය විට ආදායම් ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු කෙරෙනු ඇත. බාල භාණ්ඩයක ආදායම් ප්‍රතිවිපාකය සෘණ අගයක් ගන්නා නිසාය. භාණ්ඩයේ මිල අඩු වන විට ගැනුම්කරුවාගේ මූර්ත ආදායම් ඉහළ යන නමුදු සෘණ ආදායම් ප්‍රතිවිපාකය නිසා ඉල්ලුම් කරන ප්‍රමාණය අඩු වේ.

(ලකුණු 02 යි)

- බාල භාණ්ඩයක මිල අඩු වූ විට ආදේශන ප්‍රතිවිපාකය ඔස්සේ ඇති කෙරෙන ප්‍රසාරණාත්මක බලපෑම සෘණ ආදායම් ප්‍රතිවිපාකය ඔස්සේ ඇතිවන සංකෝචනාත්මක බලපෑමට වඩා බලවත් වේ. එබැවින් බාල භාණ්ඩය මිල අඩුවීමේ සමස්ත මිල ප්‍රතිවිපාකය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි කරයි.

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 06 යි.)


(iv) පහත දැක්වෙන ඕනෑම සාධකයක වෙනස්වීම සැපයුම් වක්‍රයේ විතැන්වීමට බලපායි.

- යෙදවුම් මිල
- වෙළෙඳපොළෙහි සැපයුම්කරුවන් සංඛ්‍යාව
- තාක්ෂණය වෙනස් වීම.
- බදු/ සහනාධාර
- නිෂ්පාදනයේ දී සම්බන්ධිත භාණ්ඩවල මිල
- භාණ්ඩයේ අනාගත මිල පිළිබඳ අපේක්ෂා
- සැලසුම් නොකළ සාධක (කාලගුණය, ස්වභාවික හේතු වැනි දෑ)


ඉහත දක්වන ලද කවර හෝ සාධක තුනක වෙනස්වීම නිසා සැපයුම් වක්‍රය වමට හා දකුණට විතැන් වන බව රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කළ යුතුයි.

උදාහරණ :


(a) යෙදවුම් මිල ඉහළ යාම :
සැපයුම් වක්‍රය වමට විතැන් වේ.





යෙදවුම් මිල පහළ යාම :
සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.




(b) සැපයුම්කරුවන් සංඛ්‍යාව අඩු වීම:
සැපයුම් වක්‍රය වමට විතැන් වේ.





සැපයුම්කරුවන් සංඛ්‍යාව වැඩි වීම :
සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.




(c) තාක්ෂණය උසස් වීම.
සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.




තාක්ෂණය පහළ වැටීම.
සැපයුම් වක්‍රය වමට විතැන් වේ.




(රූප සටහන් සමඟ එක් සාධකයකට ලකුණු 02 බැගින් සාධක තුන සඳහා මුළු ලකුණු 06 යි)

**03 වන ප්‍රශ්නය**

**3.** (i) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය නිර්වචනය කරන්න. (ලකුණු 04යි)

(ii) උපරිම මිලක් නිසා සුබසාධනය අහිමිවීමක් (deadweight loss) හටගන්නේ කෙසේ දැයි රූපසටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) රජය විසින් ඇණු වගා කරන ගොවීන්ට කිලෝග්‍රෑමයක් සඳහා රු.100ක මිල ආධාරකයක් ලබා දී ඇති අතර අතිරික්ත සැපයුම ආධාරක මිල යටතේ රජය විසින් මිල දී ගන්නා බවත් සලකන්න. වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

ඉල්ලුම: $Q_D = 240 - 2P$ සැපයුම: $Q_S = -210 + 3P$

(a) මෙම මිල ආධාරක වැඩසටහන සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණ ද? (ලකුණු 04යි)

(b) මිල ආධාරකයට පසුව පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය කොතරම් ප්‍රමාණයක් වේ ද? (ලකුණු 04යි)

(c) මිල ආධාරකය නිසා අහිමි වන සුබසාධනය ගණනය කරන්න. (ලකුණු 04යි)

03. (i) - පාරිභෝගික අතිරික්තය යනු කිසියම් භාණ්ඩයක අතිරේක ඒකකයක් ලබා ගැනීම සඳහා පාරිභෝගිකයා ගෙවන්නට කැමැත්තෙන් සිටින මිලත් (ආන්තික ප්‍රතිලාභය) එම භාණ්ඩයේ වෙළෙඳපොළ මිලත් අතර වෙනස ය.

- පාරිභෝගිකයා කිසියම් භාණ්ඩයක ඒකක කීපයක් මිල දී ගන්නා විට මුළු (සමුච්චිත) පාරිභෝගික අතිරික්තය වන්නේ මිලදී ගත් එක් එක් ඒකකයක් සඳහා හිමිවුණු පාරිභෝගික අතිරික්තයන්ගේ එකතුවයි. පෞද්ගලික ඉල්ලුම් වක්‍රයත් වෙළෙඳපොළ මිල රේඛාවත් අතර ඇති ප්‍රදේශයෙන් මෙය පෙන්නුම් කරනු ඇත.

- වෙළෙඳපොළ පාරිභෝගික අතිරික්තය ලෙස සැලකෙන්නේ වෙළෙඳපොළේ සියලුම ගැනුම්කරුවන්ගේ පෞද්ගලික පාරිභෝගික අතිරික්තයන්ගේ එකතුවය. වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රයත් වෙළෙඳපොළ මිල රේඛාවත් අතර ඇති ප්‍රදේශයෙන් මෙය පෙන්නුම් කරනු ඇත. **(ලකුණු 02 යි)**

- නිෂ්පාදක අතිරික්තය යනු කිසියම් භාණ්ඩයක අතිරේක ඒකකයක් අලෙවි කිරීමේ දී ආයතනයට ලැබෙන මිලත් එම ඒකකය නිෂ්පාදනය කිරීම සඳහා වැය වූ ආන්තික පිරිවැය (අවම සැපයුම් මිල) ත් අතර වෙනසය.

- කිසියම් භාණ්ඩයක ඒකක කීපයක් අලෙවි කිරීමේ දී ආයතනයට හිමිවන මුළු නිෂ්පාදක අතිරික්තය වන්නේ අලෙවි කළ එක් එක් ඒකකයක් සඳහා ලැබුණු පෞද්ගලික නිෂ්පාදන අතිරික්තයන්ගේ එකතුවය. ආයතනයේ සැපයුම් වක්‍රයත් වෙළෙඳපොළ මිල රේඛාවත් අතර ප්‍රදේශයෙන් මෙය පෙන්නුම් කෙරේ.

නැතහොත්

- ආයතනයේ මුළු නිෂ්පාදන අතිරික්තය වන්නේ අලෙවි කළ මුළු ඒකක ප්‍රමාණය සඳහා ලැබුණු මුළු අයභාරයත් එම ප්‍රමාණය නිෂ්පාදනය කිරීම සඳහා වැය වූ මුළු විචල්‍ය පිරිවැයත් අතර වෙනස ය.


- මුළු වෙළෙඳපොළෙහි නිෂ්පාදන අතිරික්තය ලෙස සැලකෙන්නේ සියලුම ආයතන වල පෞද්ගලික නිෂ්පාදක අතිරික්තවල එකතුවය. වෙළෙඳපොළ සැපයුම් වක්‍රයට

ඉහළින් සහ වෙළෙඳපොළ මිල රේඛාවට පහළින් ඇති ප්‍රදේශයෙන් මෙය පෙන්නුම් කෙරේ. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 04 යි)

(ii) - වෙළෙඳපොළ සමතුලිත මිලට වඩා පහළ අගයක උපරිම මිලක් නියම කළ විට වෙළෙඳපොළ සැපයුම් ප්‍රමාණය පහළ වැටෙනු ඇත. එම මිලේ දී ඉල්ලුම් ප්‍රමාණයට වඩා සැපයුම් ප්‍රමාණය අඩු බැවින් වෙළෙඳපොළේ භාණ්ඩ හිඟයක් හටගන්නා අතර එය සුබසාධනය අහිමි වී යාමට හේතු වේ. (ලකුණු 01 යි)

- කාර්යක්ෂම වෙළෙඳපොළ සමතුලිතය සඳහා ගනුදෙනු කිරීමට අවශ්‍යකරන භාණ්ඩ ප්‍රමාණයට වඩා අඩු භාණ්ඩ ප්‍රමාණයක් ගනුදෙනු වීම නිසා පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තයන්ගේ ඇතිවන අඩු වීම අහිමි වූ සුබසාධනය ලෙස සැලකේ. (ලකුණු 01 යි)




- උපරිම මිල වන $P_1$ වෙළෙඳපොළ සමතුලිත මිල වන $P_E$ ට වඩා පහළ අගයක් නියම කිරීම නිසා වෙළෙඳපොළ සැපයුම් ප්‍රමාණය $Q_E$ සිට $Q_1$ දක්වා පහළ වැටී ඇත. නිමැවුම අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමතුලිත මිල පැවැතිය දී පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන් විසින් හිමිකරගෙන තිබූ ආර්ථික අතිරික්තයෙන් කොටසක් එනම් ABC ත්‍රිකෝණයේ දක්වෙන ප්‍රමාණය උපරිම මිල නිසා සමාජයට අහිමි වී යයි. එය අහිමි වූ සුබසාධනය වේ.

(නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 01 යි. ප්‍රස්තාරය පැහැදිලි කිරීමට ලකුණු 01 යි, මුළු ලකුණු 04 යි)

(iii) (a) - ආධාරක මිල යටතේ වෙළෙඳපොළ ඉල්ලුම් ප්‍රමාණය ($Q_D$)

$Q_D$ = 240 - 2 (100)
= 240 - 200
= ඒකක 40 (ලකුණු 01 යි)


- ආධාරක මිල යටතේ වෙළෙඳපොළ සැපයුම් ප්‍රමාණය ($Q_S$)

$Q_S$ = -210 + 3 (100)
= -210 + 300
= ඒකක 90 (ලකුණු 01 යි)

- අධි සැපයුම් ප්‍රමාණය $= Q_S - Q_D$
  $= 90 - 40$
  = ඒකක 50 (ලකුණු 01 යි)
- රජයට දැරීමට සිදුවන පිරිවැය $= 50 \times 100$
  = රුපියල් 5000 (ලකුණු 01 යි)

(මුළු ලකුණු 04 යි)

(b) ආධාරක මිල යටතේ පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්ත ගණනය කිරීම සඳහා පහත ප්‍රස්තාර සටහන යොදාගත හැකිය.




- නිදහස් වෙළෙඳපොළ සමතුලිතය :

$$QD = QS$$
$$240 - 2P = -210 + 3P$$
$$450 = 3P$$
$$90 = P$$
$$60 = Q$$

- ආධාරක මිල යටතේ පාරිභෝගික අතිරික්තය : $(120 - 100) \times 40 \div 2 =$ රු. 400 (ලකුණු 02 යි)

- ආධාරක මිල යටතේ නිෂ්පාදක අතිරික්තය : $(100 - 70) \times 90 \div 2 =$ රු. 1350 (ලකුණු 02 යි)

(මුළු ලකුණු 04 යි)

(c) මිල ආධාරකය නිසා අහිමිවන සුබසාධනය :

- සමතුලිත හුවමාරුව සඳහා අවශ්‍යකරන භාණ්ඩ ප්‍රමාණය ඒකක 60ක් වුවද මිල ආධාරකය නිසා සැපයුම්කරුවන් ධෛර්යමත් වී වෙළෙඳපොළ සැපයුම ඒකක 90ක් දක්වා වැඩිකොට ඇත. ඒකක 30ක අධි නිෂ්පාදනයක් හටගෙන ඇත.

- අකාර්යක්ෂම සම්පත් භාවිතයක් මෙය පිළිබිඹු කරයි. ඒකක 60 සිට 90 දක්වා වන සෑම ඒකකයක් සඳහා ම සැපයුම් මිල (ආන්තික පිරිවැය) ඉල්ලුම් මිල (ආන්තික ප්‍රතිලාභ) ඉක්මවා ගොස් ඇත. මෙය සුබසාධනය හානියට පත් කිරීමකි. (ලකුණු 02 යි)

- ඉහත රූප සටහනෙහි ABC ත්‍රිකෝණයේ අගය පෙන්නුම් කරනුයේ මෙලෙස අහිමි වන සුබසාධනයේ ප්‍රමාණයයි. එහි අගය පහත සඳහන් ආකාරයට ගණනය කළ හැකිය.


$$(100-75)\times 30 \div 2 = 375$$

රුපියල් 375 (ලකුණු 02 යි)

(මුළු ලකුණු 04 යි)

**සටහන**


ආර්ථික අතිරික්තය අඩු වීම (reduction in economic surplus) හා අහිමිවන සුබසාධනය (deadweight loss) සමාන අර්ථ ඇති සංකල්ප නොවේ. අහිමිවන සුබසාධනය යනු අකාර්යක්ෂම නිමැවුම් මට්ටමක් වෙළෙඳපොළට ප්‍රවේශවීම නිසා පාරිභෝගික සහ නිෂ්පාදක අතිරික්තයන්ගේ අඩු වීමය. ආර්ථික අතිරික්තය අඩු වීම යනු සමාජයේ සමස්ත සුබසාධනය අඩුවීම ය. පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්ත අඩු වීම පමණක් නොව වෙළෙඳපොළට රජයේ මැදිහත්වීම නිසා හටගන්නා බදු බර ද සමාජ සුබසාධනය අඩු වීමට හේතු වේ. අහිමිවන සුබසාධන සංකල්පය නිශ්චිතවම පෙන්නුම් කරනුයේ අධි නිෂ්පාදනයක් හෝ ඌණ නිෂ්පාදනයක් නිසා පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තයන්ගේ සිදුවන අඩු වීම ය.




ඌන නිෂ්පාදන තත්ත්වයක් යටතේ අහිමි වූ සුබ සාධනය

$Q_E$ = වෙළෙඳපොළ සමතුලිත ප්‍රශස්ත නිමැවුම

$Q_1$ = ඌන නිෂ්පාදන මට්ටම




අධි නිෂ්පාදන තත්ත්වයක් යටතේ අහිමි වූ සුබ සාධනය

$Q_E$ = ප්‍රශස්ත නිමැවුම් මට්ටම

$Q_2$ = අධි නිෂ්පාදන මට්ටම

සුබසාධන ත්‍රිකෝණය හා හර්බර්ගර් ත්‍රිකෝණය වැනි නම් වලින් ද අහිමිවන සුබසාධනය නම් කොට ඇත.

**විකල්ප පිළිතුරක්**

(බොහෝ අයදුම්කරුවන් අහිමිවන සුබසාධනය සහ ආර්ථික අතිරික්තය අඩු වීම සමාන ආර්ථිකයකින් සලකා පිළිතුරු සපයා තිබූ බැවින් පහත සඳහන් විකල්ප පිළිතුර ද අදාළ කර ගත හැකිය.)

- මිල ආධාරකය නිසා අහිමිවන සුබසාධනය
- මිල ආධාරයකයට පෙර පාරිභෝගික අතිරික්තය :

$$= \{(120-90)\times 60\} \div 2 = \frac{30 \times 60}{2} = 900$$

- මිල ආධාරකයට පෙර නිෂ්පාදක අතිරික්තය :

$$=\{(90-70)\times 60\}\div 2 = \frac{20\times 60}{2} = 600$$

- මිල ආධාරකයට පෙර ආර්ථික අතිරික්තය $= 900+600$

$= 1500$ (ලකුණු 01 යි)

- මිල ආධාරකයට පසු පාරිභෝගික අතිරික්තය :

$$=\{(120-100)\times 40\}\div 2 = \frac{20\times 40}{2} = 400$$

- මිල ආධාරකයට පසු නිෂ්පාදක අතිරික්තය :

$$=\{(100-70)\times 90\}\div 2 = \frac{30\times 90}{2} = 1350$$

- මිල ආධාරකයට පසු ආර්ථික අතිරික්තය : $= 400+1350 = 1750$

(ලකුණු 01 යි)

- මිල ආධාරකයෙන් පසුව ආර්ථික අතිරික්තයේ වෙනස් වීම : $1750-1500=250$

- මිල ආධාරකයට පසු සමස්ත සුබසාධනයේ වෙනස් වීම :

ආර්ථික අතිරික්තයේ වෙනස - රජය දරන ලද වියදම

$250-5000=-4750$

සුබසාධනය 4750 කින් අඩු වී ඇත. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 04 යි)

**04 වන ප්‍රශ්නය**

4. (i) 'ප්‍රාමාණික ලාභය' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ii) පහත දැක්වෙන වියදම් ස්ථාවර පිරිවැය සහ විචල්‍ය පිරිවැය වශයෙන් වර්ගීකරණය කරන්න.

(a) අමුද්‍රව්‍ය

(b) කර්මාන්තශාලා ගොඩනැගිලි සඳහා බදු කුලිය

(c) ලබාගත් ණය මුදල් සඳහා පොලී

(d) පොහොර (ලකුණු $01\times 4=04$යි)

(iii) ඒකාධිකාරය සමග පූර්ණ තරගකාරී වෙළෙඳපොළ ව්‍යුහය සංසන්දනය කරන්න. (ලකුණු 04යි)

(iv) "ආයතන කෙටි කාලයේ දී පාඩු ලබමින් වුව ද කර්මාන්තය තුළ රැඳී සිටීමට පිළිවන." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) "මසකට රු. 200 000ක වැටුපක් ලබමින් සිටි පරිගණක මෘදුකාංග ඉංජිනේරුවරියක, ව්‍යවසායිකාවක වීමට තීරණය කොට, තමන්ගේම මෘදුකාංග සංවර්ධන ආයතනයක් ආරම්භ කරමින්, ව්‍යවසායිකාවක වූ අතර, ඇය එම ආයතනයෙන් මසකට රු. 500 000ක් උපයයි."

(a) මෙම ව්‍යවසායිකාවගේ සංක්‍රාම ඉපයීම කොපමණ ද? (ලකුණු 03යි)

(b) මෙම ව්‍යවසායිකාව ආර්ථික බදු කුලියක් උපයන්නේ ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

04. (i) - කිසියම් ව්‍යවසායකයෙකු පවත්නා නිෂ්පාදන ක්‍රියාවලියෙහි රඳවා තබා ගැනීම සඳහා එම ව්‍යවසායකයා අපේක්ෂා කරන අවම ගෙවීම ප්‍රාමාණික ලාභය වේ.

- ව්‍යවසායක කාර්යභාරයන් ඉටු කිරීම වෙනුවෙන් ලැබිය යුතු ගෙවීමක් වන නිසා ප්‍රාමාණික ලාභය ආරෝපිත පිරිවැයක් වේ. පවත්නා නිෂ්පාදන ක්‍රියාවලිය තුල එම අවම ගෙවීමවත් ඔහුට/ ඇයට නොලැබේ නම් ඔහු/ ඇය තම ව්‍යවසායකත්වය එම ව්‍යාපාරය වෙතින් ඉවත් කර ගනු ඇත. (ලකුණු 02 යි)

(ii) (a) අමුද්‍රව්‍ය - විචල්‍ය පිරිවැය

(b) කර්මාන්ත ශාලාව ගොඩනැගිලි සඳහා බදු කුලිය - ස්ථාවර පිරිවැය

(c) ලබාගත් ණය මුදල් සඳහා පොලී - ස්ථාවර පිරිවැය

(d) පොහොර - විචල්‍ය පිරිවැය

(ලකුණු 01 × 4 = 04 යි)

(iii) - පූර්ණ තරගකාරී වෙළෙඳපොළක් ඒකාධිකාරී වෙළෙඳපොළක් සමඟ සැසඳීම :

| පූර්ණ තරගය | ඒකාධිකාරය |
|---|---|
| 1. සමජාතීය නිෂ්පාදිත අලෙවිකරන සහ මිලදී ගන්නා විකුණුම්කරුවන් හා ගැනුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම. | 1. මිල දී ගන්නන් විශාල සංඛ්‍යාවක් සිටින නමුදු එක් තනි අලෙවිකරුවෙක් පමණක් සිටී. |
| 2. මෙම වෙළෙඳපොළෙහි අලෙවි කරන්නන් මිල ගනුවන් ලෙස සැලැකේ. | 2. මෙම වෙළෙඳපොළෙහි අලෙවිකරුවන් මිල සකසන්නන් (Price makers) ලෙස සැලැකේ. |
| 3. ඉතා දැඩි තරගකාරිත්වයක් පවතී. | 3. තරගකාරිත්වයක් දක්නට නැත. |
| 4. මෙම වෙළෙඳපොළෙහි සමජාතීය භාණ්ඩ දක්නට ඇත. | 4. සුවිශේෂී නිෂ්පාදිතයක් නිපදවයි. |
| 5. අලෙවිකරුවන්ට වෙළෙඳපොළ මිල පිළිබඳ කිසිදු පාලනයක් නැත. | 5. අලෙවිකරුවන්ට වෙළෙඳපොළ මිල කෙරෙහි පූර්ණ පාලන බලයක් ඇත. |
| 6. අළුත් ආයතනවලට වෙළෙඳපොළ කරා ප්‍රවේශවීමෙහිලා කිසිදු බාධකයක් නොපවතී. | 6. අළුත් ආයතනවලට වෙළෙඳපොළ කරා ප්‍රවේශවීමේ ඉතා ප්‍රබල බාධක දක්නට ලැබේ. |
| 7. ඉල්ලුම හා සැපයුම මත වෙළෙඳපොළ මිල තීරණය වන බැවින් අලෙවිකරුවන්ට මිල විශේෂණය කිරීමේ හැකියාවක් නොමැත. | 7. විවිධ ගැනුම්කරුවන් සඳහා විවිධ මිල අයකර ගැනීමේ හැකියාව පවතී. |
| 8. සියලුම ආයතන පවත්නා මිල යටතේ තමන් කැමති ප්‍රමාණ අලෙවිකරන බැවින් නිශ්චිත සැපයුම් වක්‍රයක් හඳුනාගත හැකිය. | 8. මිල විශේෂණයක් පවත්නා බැවින් (එකම ප්‍රමාණය විවිධ මිලට අලෙවි කිරීම) නිශ්චිත සැපයුම් වක්‍රයක් නොමැත. |
| 9. ආයතනය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය එකකි. | 9. ආයතනයේ ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වේ. |

(එක් වෙනස්කමකට ලකුණු 01 බැගින් ඕනෑම වෙනස්කම් හතරකට ලකුණු 04 යි)

(iv) - කෙටි කාලයේ දී පාඩු ලබන ආයතනයක් තවදුරටත් මෙහෙයුම් කටයුතු ඉදිරියට පවත්වාගෙන යනවාද නැතහොත් තාවකාලිකව වසා දමනවාද යන්න තීරණය කළ යුතුය. වසා දැමීමේ සිද්ධාන්තයෙන් (Shutdown Rule) කියවෙන්නේ කෙටි කාලයේ දී භාණ්ඩයේ මිල සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉක්මවා යන්නේ නම් ආයතනය සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කරගෙන යා යුතු බව ය. (ලකුණු 01 යි)

- ආයතනය වසා දමනු ලැබුව හොත් කිසිදු නිමැවුමක් නිෂ්පාදනය නොකෙරෙන අතර මුළු ස්ථාවර පිරිවැය ප්‍රමාණයම පාඩුවක් වශයෙන් ආයතනයට දැරීමට සිදුවීම නොවැළැක්විය හැකිය. එබැවින් කෙටි කාලයේ දී ආයතනයට ගත හැකි වඩාත් සබුද්ධික තීරණය වනුයේ ආයතනයේ මුළු අයභාරය මුළු විචල්‍ය පිරිවැය ඉක්මවා යන්නේ නම් කෙසේ හෝ ආයතනයේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ගෙන යා යුතු බව ය. (ලකුණු 01 යි)

- මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ගෙන යනවාදැයි තීරණය කිරීමේ දී ආයතනය තම මුළු අයභාරය සහ මුළු විචල්‍ය පිරිවැය සසඳා බැලිය යුතුය. මුළු අයභාරය මුළු විචල්‍ය පිරිවැය ඉක්මවා යන්නේ නම් (TR > TVC) ආයතනය තම විචල්‍ය පිරිවැය මුළුමනින්ම පියවා ගැනීමට සමත් වනවා පමණක් නොව එලෙස ඉක්මවා යන අතිරේක අයභාරය යොදා ගනිමින් ස්ථාවර පිරිවැය කිසියම් ප්‍රමාණයක් ද ආවරණය කර ගැනීමට සමත්වනු ඇත. (ලකුණු 01 යි)

- අනික් අතට ආයතනයේ මුළු විචල්‍ය පිරිවැය මුළු අයභාරය ඉක්මවා යන්නේ නම් (TVC > TR) ඉන් අදහස් කරන්නේ ආයතනය නිෂ්පාදනයට යොදන විචල්‍ය යෙදවුම් වල පිරිවැයවත් ආවරණය කර ගැනීමට අසමත් බවය. එහිදී ගත යුතු සබුද්ධික තීරණය වනුයේ ආයතනය වහාම වසා දැමීම ය. (ලකුණු 01 යි)

(මුළු ලකුණු 04 යි)

(v) (a) - මෙම ව්‍යවසායිකාවගේ සංක්‍රාම ඉපැයීම හෙවත් අවම සැපයුම් මිල මාසයකට රුපියල් 200,000 කි. (ලකුණු 03 යි)

(b) - ඔව්. මෙම ව්‍යාපාරය අපේක්ෂිත කාර්යසාධනය පෙන්නුම් කරයි නම් ව්‍යවසායිකාව එම ව්‍යාපාරයෙන් ආර්ථික බදු කුලියක් උපයා ගැනීමට සමත් වෙයි. ඇයගේ සංක්‍රාම ඉපැයීම රුපියල් 200,000ක් බැවින් මාසිකව රුපියල් 300,000ක ආර්ථික බදු කුලියක් ඇය උපයා ගනු ඇත. (ලකුණු 03 යි)

(මුළු ලකුණු 06 යි)

**05 නිබන්ධනය**

5. (i) පහත දැක්වෙන ඒකක, ජාතික ආදායම් ගිණුම්කරණයේ දී කවර ආයතනික අංශවලට අයත්වේ දැයි සඳහන් කරන්න.

(a) ධීවර කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය

(b) දකුණු පළාත් සභාව

(c) ජාතික වාණිජ මණ්ඩලය

(d) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (ලකුණු 01 × 4 = 04යි)

(ii) කිසියම් විවෘත ආර්ථිකයක් සඳහා පහත සඳහන් සාර්ව ආර්ථික දත්ත සැලකිල්ලට ගන්න.

දළ දේශීය නිෂ්පාදිතය (Y) = 500

පරිභෝජනය (C) = 350

බදු – සංක්‍රාම (ශුද්ධ බදු) = 20

ආයෝජනය (I) = 150

අයවැය හිඟය = 120 (සියලුම අගයන් රුපියල් බිලියනවලිනි)

මෙම ආර්ථිකයේ ශුද්ධ අපනයන අගය කොපමණ වේ ද? (ලකුණු 04යි)

(iii) කල්පිත සංවෘත ආර්ථිකයක සමතුලිත ජාතික ආදායම රු. බිලියන 800ක් ද, ආන්තික පරිභෝජන නැඹියාව (MPC) 0.8ක් ද, විභව නිමැවුම් මට්ටම රු. බිලියන 1 000ක් ද වේ යැයි සලකන්න.

(a) මෙම ආර්ථිකය මුහුණ දෙමින් සිටිනුයේ ප්‍රතිගාමනාත්මක පරතරයකට ද නැතහොත් උද්ධමනාත්මක පරතරයකට ද? එම පරතරයේ ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02යි)

(b) රජය විසින් සෘජු බදු යොදාගනිමින් මෙම පරතරය ඉවත් කිරීමට අදහස් කරන්නේ නම්, සෘජු බදු කොතරම් ප්‍රමාණයකින් වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ ද? (ලකුණු 02යි)

(iv) රටක ජාතික ගිණුම්වලට අදාළ දත්ත කිහිපයක් පහත වගුවෙහි දැක්වේ.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|
| මූලික මිල යටතේ දළ එකතු කළ අගය | 11 500 |
| අවශේෂ ලෝකයෙන් ලැබුණු ශුද්ධ ප්‍රාථමික ආදායම | – 300 |
| නිෂ්පාදිත මත සහනාධාර අඩු කළ බදු | 800 |
| පරිභෝජන වියදම | 8 500 |
| අවශේෂ ලෝකයෙන් ලැබුණු ශුද්ධ වර්තන සංක්‍රාම | 900 |

ඉහත දත්ත පදනම් කරගනිමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(a) දළ දේශීය නිෂ්පාදිතය

(b) දළ ජාතික ආදායම

(c) වැය කළ හැකි දළ ජාතික ආදායම

(d) දේශීය ඉතුරුම් (ලකුණු 02 × 4 = 08යි)

05. (i) (a) ධීවර කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය - මූල්‍ය නොවන සමාගමික අංශය

(b) දකුණු පළාත් සභාව - රාජ්‍ය අංශය

(c) ජාතික වාණිජ මණ්ඩලය - කුටුම්බ අංශයට සේවය කරන ලාභ නොලබන අංශය

(d) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - මූල්‍ය සමාගමික අංශය

(ලකුණු 01 × 4 = 04 යි)

(ii) ශුද්ධ අපනයන (NX) අගය :

- දළ දේශීය නිෂ්පාදිතය (Y) = C+I+G+NX
- ශුද්ධ අපනයන (NX) = Y-(C+I+G) (ලකුණු 01 යි)

- අයවැය හිඟය ශුද්ධ බදු (BD) = G - ශුද්ධ බදු (T - Tr) = 120
  BD = G - 20 = 120
  G = BD + ශුද්ධ බදු (T - Tr)
  G = 120 + 20 = 140

(ලකුණු 01 යි)

- ශුද්ධ අපනයන (NX) = Y - (C + I + G)
  = 500 - (350 + 150 + 140) (ලකුණු 01 යි)

- ශුද්ධ අපනයන = 500 - 640 = - 140
  රුපි.බිලියන - 140 (ලකුණු 01 යි)

(මුළු ලකුණු 04 යි)

(iii) (a)
- ප්‍රතිගමනාත්මක පරතරයක් පවතී. සැබෑ නිමැවුම (රුපි. බිලියන 800) විභව නිමැවුම් මට්ටමට (රුපි. බිලියන 1000) වඩා අඩු බැවිනි. (ලකුණු 01 යි)
- ප්‍රතිගමනාත්මක පරතරයේ ප්‍රමාණය රුපියල් බිලියන 200 කි.
- විභව නිමැවුම (1000) - සැබෑ නිමැවුම (800) = 200 (ලකුණු 01 යි)

(b)
- සෘජු බදු යොදා ගනිමින් ප්‍රතිගමනාත්මක පරතරය ඉවත් කළ යුතුවේ නම් සෘජු බදු පහළ හෙළිය යුතු වේ.

- කොතරම් ප්‍රමාණයකින් බදු පහළ දැමිය යුතුදැයි තීරණය කළ යුත්තේ ප්‍රතිගමනාත්මක පරතරයේ ප්‍රමාණයත් බදු ගුණකයේ විශාලත්වයත් සැලකිල්ලට ගැනීමෙනි.

- බදු ගුණකය $= \frac{b}{1 - b} = \frac{0.8}{1 - 0.8} = \frac{0.8}{0.2} = 4$ (ලකුණු 01 යි)

- ප්‍රතිගමනාත්මක පරතරය රුපියල් බිලියන 200ක් බැවින් බදු පහළ හෙළිය යුත්තේ රුපියල් බිලියන 50කිනි. (= 200 ÷ 4) (ලකුණු 01 යි)

(මුළු ලකුණු 04 යි)

(iv) (a)
- දළ දේශීය නිෂ්පාදිතය = මූලික මිල යටතේ දළ එකතු කළ අගය + නිෂ්පාදිත මත සහනාධාර අඩු කළ බදු (ලකුණු 01 යි)

- දළ දේශීය නිෂ්පාදිතය = 11,500 + 800
  = රුපි.බිලියන 12,300 (ලකුණු 01 යි)

(b)
- දළ ජාතික ආදායම = දළ දේශීය නිෂ්පාදිතය + අවශේෂ ලෝකයෙන් ලැබුණු ශුද්ධ ප්‍රාථමික ආදායම (ලකුණු 01 යි)

- දළ ජාතික ආදායම = 12,300 = (-300)
  = රුපි.බිලියන 12,000 (ලකුණු 01 යි)

(c) - වැය කළ හැකි දළ ජාතික ආදායම = දළ ජාතික ආදායම + අවශේෂ ලෝකයෙන් ලැබුණු ශුද්ධ වර්තන සංක්‍රාම

(ලකුණු 01 යි)

- වැය කළ හැකි දළ ජාතික ආදායම = 12,000+900

= රුපි.බිලියන 12,900 (ලකුණු 01 යි)

(d) - දේශීය ඉතුරුම් = දළ දේශීය නිෂ්පාදිතය - පරිභෝජන වියදම (ලකුණු 01 යි)

දේශීය ඉතුරුම් = 12,300 - 8,500

= රුපි.බිලියන 3,800 (ලකුණු 01 යි)

(මුළු ලකුණු 08 යි)

**06 වන ප්‍රශ්නය**

**'ආ' උප කොටස**

**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

6. (i) මුදලේ ප්‍රධාන කාර්යයන් කවරේ ද? (ලකුණු 04යි)

(ii) බැංකු පද්ධතියේ මුදල් මැවීමේ විභවතාව කෙරෙහි බල පෑ හැකි සාධක මොනවා ද? (ලකුණු 04යි)

(iii) පරස්පර අරමුණු දෙකක් ප්‍රශස්තකරණය කිරීමේ දී වාණිජ බැංකුවක් තම වත්කම් ව්‍යුහය කළමනාකරණය කරගන්නේ කෙසේ ද? (ලකුණු 06යි)

(iv) කෝවිඩ් - 19 වසංගතය නිසා කුටුම්බ හා ව්‍යාපාර ආයතන මුහුණ පා සිටින මූල්‍ය අසහනය විසඳීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කළ මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ කවරේ ද? (ලකුණු 06යි)

06. (i) - හුවමාරු මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.

- වටිනාකම පිළිබඳ මිනුමක් ලෙස ක්‍රියා කිරීම.
- විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම.
- වටිනාකම පිළිබඳ සංචිතයක් ලෙස යොදා ගැනීම.

(එක් කාර්යයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 04 යි)

(ii) - ණය ලබා ගැනීමට යෝග්‍ය ගනුදෙනුකරුවන් සිටීම

- ණය සඳහා ඉල්ලුමක් තිබීම
- බැංකුව සතු සල්ලි තැන්පතු ප්‍රමාණය
- ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීමට මහජනතාවගේ අභිමතය
- බැංකු පද්ධතියේ සිට බැංකු නොවන මූල්‍ය ආයතන කරා ව්‍යවහාර මුදල් කාන්දු වීම
- අධි සංචිත තබා ගැනීමට බැංකු දක්වන රුචිකත්වය
- මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

(iii) - වාණිජ බැංකු ශේෂ පත්‍රයක ඇති වත්කම් අයිතමයන් ලාභ ඉපයීම සහ සුරක්ෂිතතාව (ද්‍රවශීලතාව) රැක ගැනීම යන එකිනෙක ගැටෙන සුළු අරමුණු දෙකක් සාක්ෂාත් කර ගැනීමට දරන උත්සාහය පිළිබිඹු කරයි. (ලකුණු 02 යි)

- වෙනත් ඕනෑම ව්‍යාපාරයක් මෙන් වාණිජ බැංකු ද ලාභ උපයා ගැනීමට අපේක්ෂා

කරයි. වාණිජ බැංකු ණයදීම් සහ සුරකුම්පත් මිල දී ගැනීම් කරනුයේ මේ අරමුණ නිසාය. මේවා වාණිජ බැංකු වල ප්‍රධාන ඉපැයීමේ වත්කම් වේ. සුරක්ෂිතතාව රැක ගැනීම අනික් අරමුණය. බැංකුවේ සුරක්ෂිතතාව රඳා ඇත්තේ බැංකුව සතු ව්‍යවහාර මුදල් සහ අධි සංචිත වැනි ද්‍රවශීල වත්කම් මතය. තැන්පත්කරුවන් මුදල් ඉල්ලා සිටින විට එම ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් සංචිත තබා ගැනීමට බැංකුවට සිදුවේ.

(ලකුණු 02 යි)

- ඉහළ ප්‍රතිලාභ ලබා දෙන වත්කම්වල ආයෝජනය කිරීමට විශාල පෙළඹවීමක් බැංකුවලට පවතී. කෙසේ වෙතත් ඉහළ ඉපයීම් සහිත වත්කම් සාපේක්ෂ වශයෙන් අද්‍රවශීල වේ. අනික් අතට ද්‍රවශීලතාව කෙරෙහි ඕනෑවට වඩා සැලකිලිමත් වී අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ව්‍යවහාර මුදල් සංචිත ළඟ තබා ගැනීමෙන් බැංකුවේ ලාභදායිත්වයට හානි සිදුවී ආයෝජනය කිරීමට හා ණය ලබාදීමෙන් වැඩි ලාභ උපයා ගැනීමට ඇති අවස්ථා මේ නිසා මඟහැරී යනු ඇත. (ලකුණු 01 යි)

- මෙයින් පැහැදිලි වන්නේ ලාභය හා සුරක්ෂිතතාව අතර ගැටුමක් පවතින බවය. බැංකු කළමනාකරණයේ ප්‍රධාන ශිල්ප ක්‍රමයක් වනුයේ ලාභය හා ද්‍රවශීලතාව අතර මනා තුලනයක් ඇතිවන අයුරින් වත්කම් ගොනු සකසා ගැනීමය. සැබැවින්ම බැංකු විසින් ද්‍රවශීල වත්කම් ලෙස තබාගනුයේ මුළු වත්කම්වලින් සුළු කොටසක් වන අතර අවශේෂ වත්කම් ඉහළ ප්‍රතිලාභ ගෙනදෙන සුරකුම්පත් සහ ණයදීම් වැනි ආයෝජන සඳහා යොමු කෙරේ. (ලකුණු 01 යි)

(මුළු ලකුණු 06 යි)

(iv) - 2020 වර්ෂයේ දී ප්‍රධාන පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙළින් 4.5% සහ 5.5% වැනි ඉතා පහළ අගයක් කරා අඩුකරන ලදී.

- බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලු රුපියල් තැන්පතු වගකීම් පිළිබඳ ව්‍යවස්ථාපිත තැන්පතු අනුපාතිකය 2020 දී 2% ක් දක්වා අඩු කරන ලදී. මෙමගින් විශාල ද්‍රවශීලතාවක් දේශීය මුදල් වෙළෙඳපොළට හිමිකර දෙන ලදී.

- 2020 අප්‍රේල් මාසයේ දී මහ බැංකුව විසින් හදිසි අවස්ථාවල දී යොදා ගත හැකි පරිපාලනමය වශයෙන් තීරණය කරනු ලබන අනුපාතිකයක් වන බැංකු අනුපාතිකය (Bank Rate) 15% සිට 10% දක්වා අඩු කරන ලදී.

- සංචාරක, ඇඟලුම් අංශ ආශ්‍රිත සැපයුම්කරුවන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා පුළුල් පරාසයක ණය පමා සහනයක් (debt moratorium) ප්‍රකාශයට පත්කරන ලදී. මෙම ව්‍යාපාරවලට කාරක ප්‍රාග්ධන ණය සහ ආයෝජන අරමුණු සඳහා ණය පහසුකම් සහනදායි පොලී ප්‍රතිශත යටතේ ලබා දීමට කටයුතු කරන ලදී.

- ත්‍රීරෝද රථ සඳහා ලීසිං ණය සහ කුඩා වටිනාකමින් යුත් පුද්ගලික බැංකු ණය සහ ලීසිං ණය සඳහා ද සහනයක් ලබා දී ඇත.

- මීට අමතරව අක්‍රිය ණය සඳහා කුමන පහසුකම් සලසන ලෙසට මූල්‍ය ආයතනවලින් ඉල්ලා ඇත.

- ඇතැම් මූල්‍ය ආයතන විසින් ණයපත් සහ උකස් කටයුතු වැනි මූල්‍ය නිෂ්පාදිත සඳහා අයකරනු ලබන අධික පොලී ගාස්තු අඩුකිරීම සඳහා ඒවා නියාමනය කිරීමට මහ බැංකුව කටයුතු කරන ලදී.

- උකස් මත ලබාදෙන නිවාස ණය සඳහා උපරිම වාර්ෂික පොලී අනුපාතිකය 7% ක් ලෙස නියම කරන ලදී.

- වසංගතය නිසා බලපෑමට ලක්වූ ව්‍යාපාරික ආයතනවලට ඔවුන්ගේ ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා කාරක ප්‍රාග්ධනය සපයන 'සෞභාග්‍යා කෝවිඩ් - 19 පුනරුද පහසුකම' ඇතිකරන ලදී. ඒ යටතේ 4% සහනදායී පොලී අනුපාතිකයක් යටතේ කාරක ප්‍රාග්ධන ණය අවශ්‍යතා සපයනු ලැබේ.

**(ඕනෑම එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු හයකට ලකුණු 06 යි)**

**07 වන ප්‍රශ්නය**

7. (i) වෙළෙඳපොළ ආර්ථිකයක ඇතැම් භාණ්ඩ හා සේවා අධි පරිභෝජනයක් සහ ඇතැම් ඒවා ඌන පරිභෝජනයක් සිදුවන්නේ ඇයි? (ලකුණු 04යි)

(ii) ශුද්ධ පෞද්ගලික භාණ්ඩ හා ශුද්ධ පොදු භාණ්ඩ අතර ඇති ප්‍රධාන වෙනස්කම් කැටිකොට දක්වන්න. (ලකුණු 04යි)

(iii) පෞද්ගලීකරණයට පක්ෂව තර්ක දෙකක් සහ පෞද්ගලීකරණයට විපක්ෂව තර්ක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iv) අයවැය හිඟය පුළුල්වීමේ ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

07. (i) - මෙම තත්ත්වය පිළිබිඹු කරනුයේ පරිභෝජනය ආශ්‍රිත බාහිරතා නිසා හටගන්නා වෙළෙඳපොළ අසමත් වීමකි. බාහිරතා හේතුකොට පෞද්ගලික හා සමාජ ප්‍රතිලාභ අතර වෙනසක් හටගනී. මිල යන්ත්‍රණය විසින් සැලකිල්ලට ගනු ලබන්නේ පෞද්ගලික ප්‍රතිලාභ හා පෞද්ගලික පිරිවැය පමණක් වන බැවින් සමාජයීය වශයෙන් ප්‍රශස්ත භාණ්ඩ පරිභෝජනයක් ඇති වීමට එමගින් ඉඩ නොලැබේ. (ලකුණු 02 යි)

- කිසියම් පරිභෝජන ක්‍රියාවක් සෘණ බාහිරතා ඇතිකරන විට පෞද්ගලික ප්‍රතිලාභ සමාජ ප්‍රතිලාභ ඉක්මවා යයි. එය අධි පරිභෝජනයකට ඉඩ සලසයි. (ලකුණු 01 යි)

- කිසියම් පරිභෝජන ක්‍රියාවක් ධන බාහිරතා ඇති කරන විට සමාජ ප්‍රතිලාභ පෞද්ගලික ප්‍රතිලාභ ඉක්මවා යයි. එහි ප්‍රතිඵල වශයෙන් ඌණ පරිභෝජනයක් සිදුවනු ඇත. (ලකුණු 01 යි)

**(මුළු ලකුණු 04 යි)**

(ii)

| ශුද්ධ පෞද්ගලික භාණ්ඩ | ශුද්ධ පොදු භාණ්ඩ |
|---|---|
| 1. පරිභෝජනය තරගකාරී වේ. | පරිභෝජනයේ තරගකාරිත්වයක් නැත. |
| 2. පරිභෝජනය සීමා කළ හැකිය. | පරිභෝජනය සීමා කළ නොහැකිය. |
| 3. මිලක් අය කළ හැකිය. | මිලක් අය කළ නොහැකිය. |
| 4. ප්‍රතික්ෂේප කළ හැකිය. | ප්‍රතික්ෂේප කළ නොහැක. |
| 5. වෙළෙඳපොළ සපයයි. | වෙළෙඳපොළ සැපයීමට අසමත් වේ. |

**(ඕනෑම එක් වෙනස්කමකට ලකුණු 02 බැගින් වෙනස්කම් දෙකකට ලකුණු 04 යි)**

(iii) පෞද්ගලීකරණයට පක්ෂ තර්ක :

- රාජ්‍ය අයභාරය ඉහළ නංවා ගත හැක
- තරගකාරිත්වය වැඩි වේ
- ව්‍යවසායක සංස්කෘතියක් බිහි වේ
- විදේශ ආයෝජකයන් ආකර්ෂණය කරගත හැක
- පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන්ගෙන් බැහැර විය හැක
- රාජ්‍ය වියදම් අඩුකර ගත හැක
- වඩා තරගකාරී මිල ගණන් වෙළෙඳපොළේ ඇති වේ
- භාණ්ඩ හා සේවාවල ගුණාත්මක තත්ත්වය උසස් වේ
- නව්‍යතා සඳහා ප්‍රබල සානුබල සපයයි

(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)

පෞද්ගලීකරණයට විපක්ෂ තර්ක :

- භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහළ යනු ඇත
- රැකියා අහිමි විය හැකිය
- රැකියා සුරක්ෂිතභාවය නැති වී යනු ඇත
- රාජ්‍ය සම්පත් අහිමිවනු ඇත
- රජයට උපයාගත හැකි ලාභ අහිමි වේ
- විදේශ හිමිකාරිත්වයක් ඇතිවීමේ ඉඩකඩ

(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි

(මුළු ලකුණු 04 යි))

(iv) අයවැය හිඟය පුළුල් වීමේ ආර්ථික ප්‍රතිවිපාක :

- රාජ්‍ය ණය බර ඉහළ යාම : අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් ණය ගැනීමට සිදුවීමෙන් කාලයත් සමඟ ණය බර ඉහළ නගී.

- උද්ධමනය ඉහළ යාම : අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා රජය බැංකු පද්ධතියෙන් ණය ලබා ගත් විට මූල්‍ය ප්‍රසාරණයක් සිදුවීමෙන් ආර්ථිකයේ උද්ධමනීය ප්‍රවණතා ශක්තිමත් වනු ඇත.

- ව්‍යවහාර මුදල් වශයෙන් බාහිර අගය ක්ෂය වීම : දේශීය උද්ධමනය ශක්තිමත් වීම සහ විදේශ ණය සේවාකරණ ගෙවීම් නිසා දේශීය මුදල් ඒකකය විදේශ විනිමය වෙළෙඳපොළවල ක්ෂයවීමට පාත්‍ර වේ.

- පෞද්ගලික අංශය මත ඇති කෙරෙන තෙරපුම් ප්‍රතිවිපාකය **(Crowding out effect)**: අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා දේශීය මූල්‍ය සම්පත් යොදා ගැනීමෙන් පෞද්ගලික ආයෝජනය සඳහා ලබා ගත හැකි සම්පත්වල හිඟයක් හටගනී. මේ නිසා පෞද්ගලික ආයෝජනය අධෛර්යමත් වේ.

- පොලී අනුපාතික ඉහළ යාම : රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයම සීමිත මූල්‍ය සම්පත් ප්‍රමාණයක් ලබා ගැනීමට තරගකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථිකයේ පොලී අනුපාතික ඉහළ යාමට පිළිවන. මෙය තවදුරටත් පෞද්ගලික අංශයේ ආයෝජන පසුබෑමට ඉවහල් වනු ඇත.

- ගෙවුම් ශේෂ දුෂ්කරතා පැන නැගීම : අයවැය හිඟය මූල්‍යනය කිරීමට විදේශ මූලාශ්‍ර වලින් ලබාගත් ණය සේවාකරණය නිසා ගෙවුම් ශේෂ අර්බුද ඇතිවිය හැකිය.

- **සාර්ව ආර්ථික අස්ථායිතාව :** අධි මූල්‍ය ප්‍රසාරණය, ව්‍යවහාර මුදල ක්ෂයවීම සහ පොලී අනුපාතික ඉහළ යාම සාර්ව ආර්ථික ස්ථායිතාවට අහිතකර අන්දමින් බලපානු ඇත. තිරසාර ආර්ථික වෘද්ධි අනුපාතිකයක් අත්කර ගැනීමට සාර්ව ආර්ථික ස්ථායිතාව අත්‍යවශ්‍ය වේ.

**(පැහැදිලි කිරීම් සහිත ඕනෑම බලපෑම් හතරකට ලකුණු 02 බැගින් ලකුණු 08 යි. පැහැදිලි කිරීමක් නොමැතිව කරුණු වශයෙන් දක්වා ඇත්නම් 01 ලකුණු බැගින් ලකුණු 04 යි)**

**08 වන ප්‍රශ්නය**

8. (i) සමාන සම්පත් ප්‍රමාණයකින් A නමැති රටට මෝටර් රථ 40ක් හෝ ආහාර ටොන් 40ක් හෝ නිපදවිය හැකි බවත් B නමැති රටට මෝටර් රථ 60ක් හෝ ආහාර ටොන් 30ක් හෝ නිපදවිය හැකි බවත් සලකන්න.

(a) විශේෂ ප්‍රාගුණ්‍යනයක් නොමැති විට එක් එක් රටෙහි අභ්‍යන්තර හුවමාරු අනුපාතිකය කවරක් ද? (ලකුණු 02යි)

(b) ඉහත භාණ්ඩ නිෂ්පාදනය කිරීමෙහි ලා මෙම රටවල සාපේක්ෂ වාසි දක්නට ලැබේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) ගෙවුම් ශේෂ ලේඛනයක ශුද්ධ අපනයන සහ ජංගම ගිණුමේ ශේෂය අතර වෙනස කවරක් ද? (ලකුණු 04යි)

(iii) විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඉල්ලුම් හා සැපයුම් වක්‍ර විතැන්වීමට බලපාන ප්‍රධාන සාධක හතරක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iv) පහත දැක්වෙන විනිමය අනුපාතික ක්‍රම යටතේ මහ බැංකුවේ කාර්යභාරය කුමක් ද?

(a) ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය (ලකුණු 03යි)

(b) පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය (ලකුණු 03යි)

08. (i) (a) අභ්‍යන්තර හුවමාරු අනුපාතිකය වන්නේ ඒ ඒ රටෙහි ආවස්ථික පිරිවැය අනුපාතිකයන් ය.

A රටෙහි අභ්‍යන්තර හුවමාරු අනුපාතිකය :

- මෝටර් රථ 40 = ආහාර ටොන් 40
- මෝටර් රථ 1 = ආහාර ටොන් 1
- ආහාර ටොන් 1 = මෝටර් රථ 1 (ලකුණු 01 යි)

B රටෙහි අභ්‍යන්තර හුවමාරු අනුපාතිකය :

- මෝටර් රථ 60 = ආහාර ටොන් 30
- මෝටර් රථ 1 = ආහාර ටොන් 1/2 = (0.5)
- ආහාර ටොන් 1 = මෝටර් රථ 2 (ලකුණු 01 යි)

(b) රටවල් දෙකෙහි ආවස්ථික පිරිවැය අනුපාත වෙනස් බැවින් දෙරටටම සාපේක්ෂවාසි පවතී.

| රට | මෝටර් රථයක ආවස්ථික පිරිවැය | ආහාර ටොන් 1ක් නිපදවීමේ ආවස්ථික පිරිවැය |
|---|---|---|
| A | මෝටර් රථ 1 = ආහාර ටොන් 1 | ආහාර ටොන් 1 = මෝටර් රථ 1 |
| B | මෝටර් රථ 1 = ආහාර ටොන් 1/2 = (0.5) | ආහාර ටොන් 1 = මෝටර් රථ 2 |

**(ආවස්ථික පිරිවැය නිවැරදිව ගණනය කිරීමට ලකුණු 02 යි)**

- ආහාර නිෂ්පාදනය සඳහා අඩුම ආවස්ථික පිරිවැය ඇත්තේ A රටට ය. එබැවින් A රටට ආහාර නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය හිමි වේ. (ලකුණු 01 යි)

- මෝටර් රථ නිෂ්පාදනය පිළිබඳ අඩුම ආවස්ථික පිරිවැය ඇත්තේ B රටට ය. එබැවින් B රටට මෝටර් රථ නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය හිමි වේ. (ලකුණු 01 යි)

(මුළු ලකුණු 04 යි)

(ii) - භාණ්ඩ හා සේවා අපනයන වටිනාකමත් භාණ්ඩ හා සේවා ආනයන වටිනාකමත් අතර වෙනස ශුද්ධ අපනයන ලෙස සැලැකේ.

නැතහොත්

- ශුද්ධ අපනයන යනු ගෙවුම් ශේෂ ලේඛනයෙහි ජංගම ගිණුමේ අන්තර්ගත වෙළෙඳ භාණ්ඩ ගිණුම් ශේෂය හා සේවා ගිණුමේ ශේෂය යන දෙකේ එකතුය වේ.

(ලකුණු 02 යි)

- ජංගම ගිණුමේ ශේෂය යනු ශුද්ධ අපනයන, ශුද්ධ ප්‍රාථමික ආදායම සහ ශුද්ධ ද්විතියික ආදායම්වල සමස්ත එකතුවයි.

නැතහොත්

- ජංගම ගිණුමේ ශේෂය යනු වෙළෙඳ භාණ්ඩ ගිණුමේ ශේෂය, සේවා ගිණුමේ ශේෂය, ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය සහ ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය යන සියල්ලේ එකතුවයි (ලකුණු 02 යි)

(iii) - දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම වෙනස් වීම
- විදේශ රටවල නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම වෙනස් වීම
- රට තුළ ආයෝජනය කිරීමට ඇති කැමැත්ත වෙනස් වීම
- විදේශ රටවල ආයෝජනය කිරීමට ඇති කැමැත්ත වෙනස් වීම
- දේශීය ව්‍යවහාර මුදල් ඒකකයේ සහ විදේශීය ව්‍යවහාර මුදල් ඒකකයන්ගේ අනාගත අගයන් පිළිබඳ මුදල් වෙළෙඳුන්ගේ අපේක්ෂාවන් වෙනස්වීම
- රටවල සාපේක්ෂ උද්ධමන අනුපාතිකයන්ගේ හටගන්නා වෙනස්කම්
- රටවල සාපේක්ෂ ආදායම් මට්ටම් වෙනස් වීම
- ආයෝජන ලාභ අනුපාතික රටවල් අතර වෙනස් වීම
- රාජ්‍ය ණය ප්‍රමාණය වෙනස් වීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

(iv) (a) **ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය :**

- නිල විනිමය අනුපාතිකය පවත්වාගෙන යාම සඳහා මහ බැංකුව තමන් සතු විදේශ ව්‍යවහාර මුදල් සංචිත සක්‍රීය ලෙස භාවිත කරයි. (ලකුණු 01 යි)

- විදේශ විනිමය වෙළෙඳපොළෙහි විදේශ ව්‍යවහාර මුදලක් සඳහා අධි ඉල්ලුමක් පවත්නා විට මහ බැංකුව වහාම තමන් සතු අතිරේක විදේශ ව්‍යවහාර මුදල් වෙළෙඳපොළට මුදා හරී. (ලකුණු 01 යි)

- විදේශ විනිමය වෙළෙඳපොළෙහි කිසියම් විදේශ ව්‍යවහාර මුදලක අධි සැපයුමක් දක්නට ලැබේනම් මහ බැංකුව අතිරේක විදේශ මුදල් වෙළෙඳපොළෙන් මිලදී ගනිමින් (අවශෝෂණය කරමින්) අධි සැපයුම ඉවත් කරයි.

- මහ බැංකුවේ මෙම ක්‍රියාමාර්ග විශ්වාසනීය ස්ථාවර විනිමය අනුපාතිකයක් ආරක්ෂා කරගෙන යාමට ඉවහල් වේ. (ලකුණු 01 යි)

(මුළු ලකුණු 03 යි)

(b) පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය :

- විදේශ විනිමය වෙළෙඳපොළෙහි උච්චාවචන සහ චංචලතාවන් පාලනය කිරීම පිණිස මහ බැංකුව විදේශ විනිමය වෙළෙඳපොළෙහි විදේශ ව්‍යවහාර මුදල් විකිණීම සහ මිල දී ගැනීම (අවශෝෂණය) කරනු ලැබේ. (ලකුණු 01 යි)

- විදේශ විනිමය වෙළෙඳපොළෙහි තම ව්‍යවහාර මුදල් ඒකකය ක්ෂයවීම වළක්වා ගැනීම සඳහා මහ බැංකුව තමන්ගේම ව්‍යවහාර මුදල් මිල දී ගෙන ඒ වෙනුවට විදේශ ව්‍යවහාර මුදල් සපයනු ලැබේ. එවිට ක්ෂයවීමේ ප්‍රවණතාව කිසියම් දුරකට සමනය වේ. (ලකුණු 01 යි)

- විදේශ විනිමය වෙළෙඳපොළෙහි තම ව්‍යවහාර මුදල් ඒකකයේ අගය ඉහළ යාමේ ප්‍රවණතාවක් ඇත්නම් එය වළක්වාලීම පිණිස තමන්ගේම ව්‍යවහාර මුදල් අලෙවි කරමින් විදේශ ව්‍යවහාර මුදල් මිලයට ගැනීමේ යෙදේ. එමගින් විනිමය අනුපාතිකය ඉහළ යාමේ ප්‍රවණතාව පාලනය කළ හැකි වේ.

(ලකුණු 01 යි)

(මුළු ලකුණු 03 යි)

| |
|---|
| 9. (i) ආර්ථික වෘද්ධිය යනු කුමක් ද? ආර්ථික වෘද්ධි අනුපාතිකයෙන් එය වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 04යි) |
| (ii) "සංවර්ධනය වූ කලී බහුමාන ක්‍රියාවලියකි." පැහැදිලි කරන්න. (ලකුණු 04යි) |
| (iii) වර්තමාන ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ ආංශික සංයුතිය (කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා), දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සමඟ සසඳන්න. (ලකුණු 06යි) |
| (iv) ආයෝජකයන්ට මඟපෙන්වන පහත දැක්වෙන ප්‍රධාන දර්ශකයන්ට අනුව ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය කුමක් ද? |
| (a) ව්‍යාපාර කරගෙන යාමේ පහසුව පිළිබඳ දර්ශකය (Ease of Doing Business Index) (ලකුණු 02යි) |
| (b) ගෝලීය තරගකාරිත්ව දර්ශකය (Global Competitiveness Index) (ලකුණු 02යි) |
| (c) දූෂණ සංජානන දර්ශකය (Corruption Perception Index) (ලකුණු 02යි) |

09. (i) - ජාතික නිමැවුම් හා ආදායම් මට්ටම් ඉහළ නැංවීම උදෙසා කාලයත් සමග ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමැවුම ප්‍රසාරණය කිරීම ආර්ථික වෘද්ධිය ලෙස හැඳින්විය හැකිය. එය ඉල්ලුම, සැපයුම සහ කාර්යක්ෂමතාව යන සාධකයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය තුළින් හටගන්නා ගතික ක්‍රියාවලියකි. (ලකුණු 02 යි)

- කිසියම් කාල පරිච්ඡේද දෙකක් අතර මූර්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි හෝ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයෙහි හෝ වෙනස ප්‍රතිශතාත්මකව දැක්වීම ආර්ථික වෘද්ධි අනුපාතිකය වේ. (ලකුණු 01 යි)

- ආර්ථික වෘද්ධි අනුපාතිකයෙන් මැනෙනුයේ නිමැවුමෙහි හටගත් සැබෑ වෙනස්වීම වන නමුදු ආර්ථික වෘද්ධියෙන් මැනෙනුයේ ආර්ථිකයේ විභව නිෂ්පාදන ධාරිතාවේ ප්‍රසාරණයයි. (ලකුණු 01 යි)

(මුළු ලකුණු 04 යි)

(ii) - සංවර්ධනය වූ කලී බහුමානීය ක්‍රියාවලියකි. එම ක්‍රියාවලිය තුළ ආර්ථික මෙන්ම ආර්ථික නොවන පැතිකඩ ද එකසේ වැදගත් වේ. එබඳු සංවර්ධන ක්‍රියාවලියක් වෘද්ධිය හා සාධාරණත්වය වැනි අරමුණු සමගාමීව සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වේ. (ලකුණු 01 යි)

- සංවර්ධනය යනු ජීවිතයේ ගුණාත්මක තත්ත්වය උසස් වීමය. 'බහුමාන ක්‍රියාවලිය' යන යෙදුමෙන් ම අදහස් වන්නේ සංවර්ධනය යනු හුදෙක් තනි සාධකයක් නොවන බවය. සමාජ සංවර්ධනය, ආර්ථික සංවර්ධනය, පාරිසරික කළමනාකරණය, ස්ත්‍රී පුරුෂ සමානතාව, දේශපාලනික සවිබල ගැන්වීම, ප්‍රජා විද්‍යාත්මක සංවර්ධනය වැනි පුළුල් ක්ෂේත්‍ර රැසක් එමගින් ආවරණය කෙරේ. (ලකුණු 02 යි)

- වර්තමානයේ පුළුල් ලෙස භාවිත කෙරෙන බහුමානීය සංවර්ධන දර්ශකයක් වන්නේ මානව සංවර්ධන දර්ශකයයි. සංවර්ධනය පිළිබඳ පුළුල් පැතිකඩ තුනක් පදනම් කර ගනිමින් එය සකසා ඇත. ආර්ථික පැතිකඩ සඳහා සතුටුදායක ජීවන මට්ටමක් පිළිබිඹු කිරීමට ක්‍රයශක්ති සාම්‍ය ප්‍රතිශීර්ෂ ආදායම යොදා ගනී. සමාජ පැතිකඩක් ලෙස දීර්ඝ හා නීරෝගී ජීවිතයක් පිළිබිඹු කිරීමට උපතේ දී ආයු අපේක්ෂාව යොදා ගනී. තවත් සමාජ පැතිකඩක් වන දැනුම පිළිබිඹු කිරීමට පාසල් අධ්‍යාපනය ලැබූ වසර ගණන යොදා ගෙන ඇත.

- මානව සංවර්ධන දර්ශකය වුවද ආවරණය කරනුයේ සංවර්ධනය පිළිබඳ සංක්ෂිප්ත හා ඉතා සීමිත ක්ෂේත්‍රයකි. අසමානතාව, දරිද්‍රතාව, සවිබල ගැන්වීම, මානව සුරක්ෂිතතාව වැනි සංවර්ධනය අදාළ ක්ෂේත්‍ර කිසිවක් එමගින් පෙන්නුම් නොකෙරේ.

(ලකුණු 01 යි)

(මුළු ලකුණු 04 යි)

(iii)

| අංශය | 2020 | | 2019 | |
|---|---|---|---|---|
| | ද.දේ.නි. | සේවා නියුක්තිය | ද.දේ.නි. | සේවා නියුක්තිය |
| කෘෂිකර්මාන්ත | 7.0% | 27.1% | 6.9% | 25.3% |
| කර්මාන්ත | 25.5% | 26.9% | 26.4% | 27.6% |
| සේවා | 58.7% | 46% | 57.5% | 47.1% |

(එක් නිවැරදි සංඛ්‍යා දත්තයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 06 යි)

(iv)

| දර්ශකය | ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත වීම |
|---|---|
| ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව පිළිබඳ දර්ශකය (2020) | 99/190 |
| ගෝලීය තරඟකාරිත්වය පිළිබඳ දර්ශකය (2020) | 84/141 |
| දූෂණ සංජානන දර්ශකය (2020) | 94/180<br>102/180 (2021) |

(එක් දර්ශකයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 06 යි)

## 10 වන ප්‍රශ්නය

10. (i) ව්‍යාවහාර මුදල් හුවමාරු ගිවිසුමක් (currency swap agreement) යනු කවරක් ද? ශ්‍රී ලංකාව ඇසුරෙන් නිදසුනක් දක්වන්න. (ලකුණු 04යි)

(ii) ආයෝජක විශ්වාසනීයත්වයට සහ තරගකාරිත්වයට බාධා කෙරෙන ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ගැටලුකාරී ක්ෂේත්‍ර සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) ශ්‍රී ලංකා ආර්ථිකය වර්තමානයේ මුහුණ පා සිටින විදේශ විනිමය අර්බුදය විසඳා ගැනීම සඳහා ඔබට යෝජනා කළහැකි ප්‍රතිපත්ති නිර්දේශ කවරේද? (ලකුණු 04යි)

(iv) මෑත වර්ෂවල ආර්ථික වෘද්ධි අනුපාතිකය, අයවැය හිඟය, ජංගම ගිණුම් හිඟය සහ රාජ්‍ය ණය යන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකා ආර්ථිකය පෙන්නුම් කළ කාර්යසාධනය යෝග්‍ය දත්ත යොදාගනිමින් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 08යි)

10. (i) - ව්‍යවහාර මුදල් හුවමාරු ගිවිසුමක් යනු පාර්ශ්ව දෙකක් විසින් එක හා සමාන වටිනාකමකින් යුත් ව්‍යවහාර මුදල් දෙවර්ගයක් කිසියම් නිශ්චිත කාලයකට එකිනෙකා අතර හුවමාරු කර ගැනීම සඳහා ඇතිකර ගනු ලබන ගිවිසුමකි. හුවමාරු කරගත් මුදල් ප්‍රමාණය වෙනුවෙන් පොලී අනුපාතිකයන් ද දෙපාර්ශ්වය විසින් එකිනෙකාට ගෙවනු ලැබේ.

- උදාහරණයක් වශයෙන් එක් පාර්ශ්වයක් රුපියල් මිලියන 2000 ක් තවත් පාර්ශ්වයකට ලබා දී ඒ වෙනුවට ඇමෙරිකානු ඩොලර් මිලියන 10ක් අනෙක් පාර්ශ්වය වෙතින් ලබා ගත්තා යයි සලකමු. මෙම ගනුදෙනුවට අනුව විනිමය අනුපාතිකය $ 1 = රුපි. 200ක් වී තිබේ. ගිවිසුම් කාලය අවසානයේ දී නැවතත් එම මුදල් ප්‍රමාණය මුලින් හිමිකර ගෙන තිබූ ආකාරයට එකඟ වූ විනිමය අනුපාතිකයක් යටතේ දෙපාර්ශ්වය අතර බෙදා ගැනේ. (ලකුණු 02 යි)

**ව්‍යවහාර මුදල් ගිවිසුම් සඳහා උදාහරණ :**

- 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සහ චීන මහජන බැංකුව අතර යුවාන් බිලියන 10ක් (ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5) වසර තුනක කාලයක් සඳහා හුවමාරු කර ගැනීම.

- 2021 දී ශ්‍රී ලංකා මහ බැංකුව බංග්ලාදේශයේ මහ බැංකුව සමඟ ඩොලර් මිලියන 200ක් හුවමාරු කර ගැනීම.

- 2020 දී ශ්‍රී ලංකා මහ බැංකුව ඉන්දියානු සංචිත බැංකුවෙන් ඩොලර් මිලියන 400ක් හුවමාරු කර ගැනීමේ ගිවිසුම

(ඕනෑම එක් උදාහරණයකට ලකුණු 02 යි)

(මුළු ලකුණු 04 යි)

(ii)
- සාර්ව ආර්ථික අස්ථායිතාව
- ශ්‍රම වෙළෙඳපොළෙහි පවත්නා සීමාකාරී නීති
- ප්‍රතිපත්ති පිළිබඳ අවිනිශ්චිතතාව
- දූෂණය සහ අල්ලස් ගැනීම්
- අකාර්යක්ෂම බදු ව්‍යුහය
- තීරු බදු ව්‍යුහය සංකීර්ණ වීම
- විඥාපන හා පරිගණක තාක්ෂණයට අනුගත වීම මන්දගාමී වීම
- අධිකරණ හා නීති ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය අකාර්යක්ෂම වීම
- දුර්වල යටිතල පහසුකම්
- රාජ්‍ය නිලබල තන්ත්‍රයේ අකාර්යක්ෂමතා
- නව්‍යතා බිහිකිරීම සඳහා ප්‍රමාණවත් ධාරිතාවක් නොතිබීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

(iii) කෙටිකාලීන ක්‍රියාමාර්ග :
- අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම
- පවත්නා විදේශ ණය ප්‍රති ව්‍යුහගත කිරීම
- ව්‍යාපාර මුදල් හුවමාරු ගිවිසුම් ඇතිකර ගැනීම
- විනිමය අනුපාතිකය වෙළෙඳපොළ බලවේග යටතේ තීරණය වීමට ඉඩ හැරීම
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගැනීම

දිගු කාලීන ප්‍රතිපත්ති :
- අපනයන අංශය පුනර්ජීවනය කිරීම
- සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීම
- රාජ්‍ය මූල්‍ය ස්ථායිතාව සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම
- ගෝලීය නිෂ්පාදන ජාලවලට ප්‍රවේශය ලබා ගැනීම
- රටට හිතකර නිදහස් වෙළෙඳ ගිවිසුම් කරා එළැඹීම
- සෘජු විදේශ ආයෝජන සඳහා හිතකර පරිසරයක් ඇති කිරීම
- පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයට ආයෝජනය කිරීම
- කාර්යක්ෂම ආනයන ආදේශන වැඩසටහන් ක්‍රියාවට ගැනීම
- විදේශගත ශ්‍රමිකයනට වඩාත් ආකර්ශණීය පහසුකම් ලබා දීම

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

(iv) ආර්ථික වෘද්ධි අනුපාතිකය :

- ශ්‍රී ලංකාව මෑත වර්ෂවල තිරසාර වෘද්ධි අනුපාතිකයක් අත්කර ගැනීමට අසමත් වී ඇත. මෑත වර්ෂවල දී වෘද්ධි අනුපාතිකය ඉතා පහළ අගයන් වාර්තා කොට ඇත. (ලකුණු 01 යි)

ආර්ථික වෘද්ධි අනුපාතික :

2018 : 3.3%

2019 : 2.3%

2020 : -3.6% (ලකුණු 01 යි)

- අයවැය හිඟය : මෑත වර්ෂවල අයවැය හිඟය සීඝ්‍රයෙන් පුළුල් වී ඇත. විශාල වශයෙන් රාජ්‍ය බදු අයභාරයේ පහළ වැටීමක් පුනරාවර්තන වියදම් විශාල වශයෙන් ඉහළ යාමත් මෙයට බලපා ඇත. කෝවිඩ් - 19 වසංගතයේ බලපෑම නිසා ආර්ථික ක්‍රියාකාරකම් සංකෝචනය වීමත් ඒ ආශ්‍රිත රජයේ වියදම් ඉහළ යාමත් නිසා මෙය තවදුරටත් තීව්‍ර විය. (ලකුණු 01 යි)

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් අයවැය හිඟය :

2018 : 5.3%

2019 : 9.6%

2020 : 11.1% (ලකුණු 01 යි)

- වෙළෙඳ හිඟය : වෙළෙඳ ශේෂය මෑත වර්ෂවල ක්‍රමයෙන් පහළ වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කොට ඇත. අපනයන ඉපයීම්වල සැලකිය යුතු වර්ධනයක් නොතිබිය දී ආනයන වියදම් සීඝ්‍රයෙන් පහළ වැටීම මෙහිලා ප්‍රධාන වශයෙන් බලපා තිබේ. (ලකුණු 01 යි)

- වෙළෙඳ ශේෂය : 2018 : මිලියන 10343

  2019 : මිලියන 7997

  2020 : මිලියන 6008

- වෙළෙඳ ශේෂය ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස :

  2018 : 11.7%

  2019 : 9.5%

  2020 : 7.4% (ලකුණු 01 යි)

- රාජ්‍ය ණය : නොපිය වූ රාජ්‍ය ණය ප්‍රමාණය නාමික වශයෙන් ගත්විට පසුගිය කාලපරිච්ඡේදය මුළුල්ලේ ම අඛණ්ඩව ඉහළ ගොස් ඇති නමුදු මෑත වර්ෂවල දී එහි වර්ධනය වඩාත් සීඝ්‍ර වී ඇත. මෑත වර්ෂවල දී නාමික වශයෙන් සහ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ද රාජ්‍ය ණය වර්ධනය වී ඇත්තේ ප්‍රධාන වශයෙන් රාජ්‍ය අයභාරය පහළ වැටීමක් පුනරාවර්තන වියදම් විශාල ලෙස ඉහළ යාමක් නිසාය. (ලකුණු 01 යි)

- මධ්‍යම රජයේ නොපියවා ඇති ණය ප්‍රමාණය :
  2018 : රු.බිලියන 12031 (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 83.7%)
  2019 : රු.බිලියන 13032 (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 86.8%)
  2020 : රු.බිලියන 15117 (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 101%)

- නොපියවූ මුළු රාජ්‍ය ණය :
  2018 : රු.බිලියන 13178 (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 91.7%)
  2019 : රු.බිලියන 14155 (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 94.3%)
  2020 : රු.බිලියන 16427 (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 109.7%)

(ලකුණු 01 යි)

(මුළු ලකුණු 08 යි)



Past Papers Wiki - Download More Past Papers and Study Well!